75 YEARS
STABILITY FOR PROSPERITY
1950-2025

මුදල් ප්‍රතිපත්ති වාර්තාව

2025 අගෝස්තු

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

මුදල් ප්‍රතිපත්ති වාර්තාව වසරකට දෙවරක් පළ කෙරෙනු ලබන ප්‍රකාශනයකි. මෙම වාර්තාවේ අන්තර්ගතය, 2025 වසරේ ජූලි මස 23 වැනි දින සිදු කළ මුදල් ප්‍රතිපත්ති නිවේදනය සමඟ නිමාවට පත් වුණු ශ්‍රී ලංකා මහ බැංකුවේ 2025 වසරේ ජූලි මාසයේ මුදල් ප්‍රතිපත්ති තීරණ වාරය වනවිට පැවති දත්ත මත මූලික වශයෙන් පදනම් වේ.

© ශ්‍රී ලංකා මහ බැංකුව

ISBN 978-624-6764-09-8

2025 අගෝස්තු 15

පටුන

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති රාමුව 4

සාරාංශය 6

1. මුදල් ප්‍රතිපත්ති සාරාංශය 7

2. උද්ධමනයේ සහ ආර්ථිකයේ ඉදිරි දැක්ම 9

2.1. මූලික පුරෝකථන 9
උද්ධමනය පිළිබඳ ඉදිරි දැක්ම 9
විශේෂ සටහන (අ): මිලෙහි ගතික බලපෑම සහ පදනම් බලපෑම පිළිබඳ දැනුම්වත් වීම 13
මූර්ත ආර්ථික වර්ධනය පිළිබඳ ඉදිරි දැක්ම 14

2.2. පුරෝකථන සඳහා පාදක වන ප්‍රධාන උපකල්පන 15
ගෝලීය පරිසරය 15
රාජ්‍ය මූල්‍ය අංශයේ ගමන් මග 16
විදේශීය ජංගම ගිණුම 16

2.3. මූලික පුරෝකථන මත පවතින අවදානම් 16
උද්ධමන පුරෝකථන මත පවතින අවදානම් 16
ආර්ථික වර්ධන පුරෝකථන මත පවතින අවදානම් 17

2.4. පෙර පුරෝකථන සමඟ සැසඳීම 18
මැදි කාලීන පුරෝකථන සඳහා භාවිත කළ ප්‍රධාන උපකල්පන 18
උද්ධමනයේ හැසිරීම 19

3. වර්තමාන ආර්ථික තත්ත්වය 21

3.1. උද්ධමනය 21
විශේෂ සටහන (ආ): සේවා උද්ධමනය පිළිබඳ දැනුම්වත් වීම: එය වැදගත් වන්නේ ඇයි? 25

3.2. මූර්ත අංශය 27

3.3. මුදල් අංශය 29
පොලී අනුපාතික 29
දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාවය 31
දේශීය ණය තත්ත්ව සහ මුදල් සැපයුම 32

3.4. විදේශීය අංශය 34
ගෙවුම් තුලනය 34
විනිමය අනුපාතිකය 37
සංචිත වත්කම් 38

3.5. රාජ්‍ය මූල්‍ය අංශය 38

3.6. මූල්‍ය අංශය 40

3.7. ගෝලීය ප්‍රවණතා 42

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති රාමුව

2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත යටතේ දේශීය මිල ස්ථායීතාව ළඟා කර ගැනීම හා පවත්වාගෙන යෑම ශ්‍රී ලංකා මහ බැංකුවේ මූලික අරමුණයි. මිල ස්ථායීතාව මගින්, එනම් උද්ධමනය අඩු සහ ස්ථාවර මට්ටමක පවත්වාගෙන යෑමෙන්, මහ බැංකුව දිගු කාලීන ආර්ථික වර්ධනය ප්‍රවර්ධනය කිරීමට දායක වෙයි. එමගින්, මහජනතාවගේ ආර්ථික හා මූල්‍ය යහපැවැත්ම වෙනුවෙන් දායක වෙයි.

ශ්‍රී ලංකා මහ බැංකුව, දේශීය මිල ස්ථායීතාව පවත්වා ගැනීමේ සිය මූලික අරමුණ ළඟා කර ගැනීම සඳහා මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරයි. මහ බැංකු පනතට අනුව, මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය[1] මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්තිය සකස් කිරීම සහ නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවට අනුකූලව නම්‍යශීලී විනිමය අනුපාතික ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ වගකීම දරයි. මුදල් අමාත්‍යවරයා සහ මහ බැංකුව අතර ඇති කරගත් මුදල් ප්‍රතිපත්ති රාමු ගිවිසුම මගින් තීරණය කර ඇති ඉලක්කගත මට්ටමේ උද්ධමනය පවත්වාගෙන යෑම මෙම නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවේ අරමුණයි. 2023 ඔක්තෝබර් මස රජයේ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කරන ලද වත්මන් මුදල් ප්‍රතිපත්ති රාමු ගිවිසුමට අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව කාර්තුමය මතුපිට උද්ධමනය 5%ක අගයක පවත්වා ගත යුතුය.[2] මුදල් ප්‍රතිපත්ති රාමු ගිවිසුම යටතේ, උද්ධමනයේ ඇතිවිය හැකි අපගමනයන් මැනීමට හා මහ බැංකුවේ වගවීමේ අවශ්‍යතාවට අදාළව ප්‍රතිශතාංක ±2ක ආන්තිකයක් ලබා දෙයි. අනුක්‍රමික කාර්තු දෙකක් සඳහා උද්ධමනය උක්ත අගයෙහි පවත්වා නොගතහොත් මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින් මුදල් අමාත්‍යවරයා හරහා පාර්ලිමේන්තුව වෙත වාර්තාවක් ඉදිරිපත් කළ යුතු අතර, එයට මහජනතාවට ද ප්‍රවේශ විය හැකි විය යුතුය.

උද්ධමන ඉලක්කය ළඟා කරගැනීම සඳහා මහ බැංකුව කෙටි කාලීන වෙළඳපොළ පොලී අනුපාතික ඉලක්කගත මග ඔස්සේ මෙහෙයවීමට සිය මුදල් ප්‍රතිපත්ති උපකරණ භාවිත කරයි. 2024 වසරේ නොවැම්බර් මස සිට ද්විත්ව පොලී අනුපාතික ක්‍රමයේ සිට තනි පොලී අනුපාතික ක්‍රමවේදය වෙත යොමු වීමෙන් අනතුරුව, එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය මහ බැංකුවේ ප්‍රධාන ප්‍රතිපත්ති උපකරණය ලෙස ක්‍රියාත්මක වෙයි. එය මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සන්නිවේදනය හා ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගැනෙයි. වත්මන් රාමුව තුළ, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය මහ බැංකුවේ මෙහෙයුම් ඉලක්කය ලෙස පවතී. බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය, ප්‍රකාශයට පත් කරන ලද එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය මත හෝ ඒ ආසන්නව පවත්වාගෙන යෑමට මහ බැංකුව කටයුතු කරයි. පවත්නා මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට අනුකූලව, එක්දින වෙළඳපොළ පොලී අනුපාතික මූල්‍ය වෙළඳපොළ හරහා ආර්ථිකයට සම්ප්‍රේෂණය වන අතර, එය අවසානයේ උද්ධමනය කෙරෙහි බලපෑම් ඇති කරයි.

මුදල් ප්‍රතිපත්ති තීරණ ඉදිරි දැක්මක් සහිත සහ දත්ත මත පදනම් වේ. මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග උද්ධමනය කෙරෙහි බලපෑමක් ඇති කිරීමට කාලයක් ගතවන බැවින්, ඉදිරි දැක්මක් සහිත ප්‍රවේශයක් අත්‍යවශ්‍ය වේ. සුදුසු මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය තීරණය කිරීම සඳහා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය වසරකට සය වතාවක් රැස් වේ. මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය, සිය තීරණ ගැනීමේ දී වත්මන් උද්ධමනය සහ එහි ඉදිරි දැක්ම, ආර්ථිකයේ තත්ත්වය සහ අනාගත ආර්ථික අපේක්ෂා මෙන්ම එවැනි පුරෝකථන හා සම්බන්ධ අවදානම් හා අවිනිශ්චිතතා

[1] මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය මහ බැංකු අධිපතිවරයා, මහ බැංකුවේ පාලක මණ්ඩලයේ සාමාජිකයින්, මිල ස්ථායීතාව සහ මූල්‍ය පද්ධති ස්ථායීතාව භාර මහ බැංකුවේ නියෝජ්‍ය අධිපතිවරුන් මෙන්ම ආර්ථික විද්‍යාව හා මූල්‍ය යන ක්ෂේත්‍රවල විශේෂඥයන් දෙදෙනෙකුගෙන් සමන්විත වේ.

[2] අංක 2352/20 දරන අති විශෙෂ ගැසට් පත්‍රය මගින් උද්ධමන ඉලක්කය මහජනතාවට සන්නිවේදනය කරන ලදී. කාර්තුමය මතුපිට උද්ධමනය යනු අනුරූප කාර්තුවේ මාස තුන තුළ මාසිකව කොළඹ පාර්භෝගික මිල දර්ශකයේ (කො.පා.මි.ද.) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස්වීමේ සරල සාමාන්‍යයයි.

පිළිබඳ ඇගයීමක් සිදු කරයි. මෙම රැස්වීම්වල දී සැලකිල්ලට ගනු ලබන පුරෝකථන, පවතින දත්ත, ප්‍රධාන සාර්ව ආර්ථික විචල්‍යයන්ගේ කෙටි කාලීන පුරෝකථන සහ ගෝලීය ආර්ථික දර්ශකවලට අදාළ පුරෝකථන මෙන්ම කාර්ය මණ්ඩල විනිශ්චයන් මත පදනම් වේ. මහ බැංකු අධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් යුතු අභ්‍යන්තර කමිටුවක් වන මුදල් ප්‍රතිපත්ති කමිටුව සුපරික්ෂාකාරීව කරුණු සලකා බැලීමකින් අනතුරුව මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයේ සලකා බැලීම සඳහා ප්‍රතිපත්ති නිර්දේශ සපයයි.

මහ බැංකු පනතේ 27 සහ 80 වන වගන්ති ප්‍රකාරව මුදල් ප්‍රතිපත්ති වාර්තාව සකස් කර ඇත. මෙම වගන්තිවලට අනුව වත්මන් උද්ධමන ප්‍රවණතා, උද්ධමනය සඳහා බලපාන සාධක, මැදි කාලීන උද්ධමන පුරෝකථන හා එවැනි පුරෝකථන සඳහා ඇති ප්‍රධාන අවදානම් මෙන්ම මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සහ එහි අරමුණු ළඟා කර ගැනීම පිළිබඳව විස්තර කෙරෙන ද්විවාර්ෂික වාර්තාවක් මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කිරීම අවශ්‍ය වේ. මෙම වාර්තාව ආර්ථිකයේ වර්ධන ඉදිරි දැක්ම පිළිබඳ තක්සේරුවක් සපයන අතරම, දේශීය ආර්ථිකයේ වත්මන් ප්‍රවණතා මෙන්ම ගෝලීය ආර්ථිකය පිළිබඳව ද මහජනතාවට තොරතුරු සපයයි.

01 රූප සටහන: ශ්‍රී ලංකාවේ මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීමේ ක්‍රියාවලිය *(වසරකට සය වතාවක්)*



සාරාංශය

2024 වසරේ සැප්තැම්බර් මස සිට උද්ධමනය සෘණ අගයක පැවතුණි. මෙම අවධමන තත්ත්වය සඳහා බලශක්ති සහ ප්‍රවාහන සම්බන්ධ මිල අඩු කිරීම් මෙන්ම පෙර වසරවලට සාපේක්ෂව ආහාර මිල ගණන් අඩු වීම ද සැලකිය යුතු ලෙස දායක විය. කෙසේ වෙතත්, ප්‍රධාන වශයෙන්ම ආහාර උද්ධමනය ඉහළ යෑම හේතුවෙන් 2025 වසරේ මාර්තු මස සිට අවධමන තත්ත්වය ලිහිල් වෙමින් පවතින අතර, වසර තුළ බලශක්ති මිල ගණන් ඉහළ නංවමින් සිදු කළ සංශෝධනයන්ද මෙයට දායක විය. දැනට පවතින කෙටි කාලීන අවධමන කාලපරිච්ඡේදය නිෂ්පාදකයන්ගේ හැසිරීමට හෝ සමස්ත ආර්ථික ක්‍රියාකාරකම්වලට අහිතකර බලපෑමක් සිදු කර නොමැති අතර, එය ගෘහ ඒකකවල ජීවන වියදම් බර යම්තාක් දුරකට ලිහිල් කිරීමට දායක වී ඇත.

2025 වසරේ තෙවන කාර්තුවේ දී අවධමන තත්ත්වය අවසන් වනු ඇතැයි අපේක්ෂා කරන අතර, අනතුරුව උද්ධමනය ක්‍රමයෙන් ඉහළ ගොස් 2026 වසරේ මැද භාගයේ දී 5%ක ඉලක්කගත මට්ටමට ළඟා වනු ඇත. මැදි කාලීනව, උද්ධමන ගමන් මගෙහි තාවකාලික ඉහළ යෑම් ඇති වුවත්, උද්ධමනය 5% ඉලක්කය ආසන්නයේ ස්ථාවර වනු ඇතැයි පුරෝකථනය කෙරේ. වර්තමානයේ පහළ ධන අගයක පවත්නා මූලික උද්ධමනය, ක්‍රමයෙන් ඉහළ ගොස් මැදි කාලීනව ස්ථාවර වනු ඇතැයි අපේක්ෂිතය. උද්ධමනය පුරෝකථනය කළ මට්ටමට වඩා ඉහළ යෑම හෝ පහළ යෑම සඳහා බලපෑ හැකි අවදානම් පවතී. කෙසේ වෙතත්, ඉදිරි කාලයේ දී උද්ධමන පුරෝකථන සාක්ෂාත් වීම සම්බන්ධයෙන් අවදානම් තක්සේරුව වඩාත් තුලිත ඉදිරි දැක්මක් සපයයි.

ආර්ථිකයේ ඉල්ලුම පදනම් කරගත් උද්ධමන පීඩන අඩුවීම මධ්‍යයේ මහ බැංකුව ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයක් පවත්වා ගත්තේය. ආර්ථිකයේ සියලුම ප්‍රධාන අංශ ආවරණය වන පරිදි පෞද්ගලික අංශයට ලබාදෙන ණය ප්‍රසාරණය වේගවත් කිරීමට පහසුකම් සලසමින් වෙළඳපොළ පොලී අනුපාතික සැලකිය යුතු ලෙස අඩු වී ඇත.

ගෝලීය ආර්ථික ප්‍රතිපත්ති සම්බන්ධ අවිනිශ්චිතතා උද්ගත වීම මධ්‍යයේ වුවද 2025 වසරේ මේ දක්වා කාලය තුළ විදේශීය අංශයේ ක්‍රියාකාරීත්වය, ඉහළ ඔරොත්තු දීමේ හැකියාවක් පෙන්නුම් කළේය. ආනයන ඉල්ලුම පුළුල් වුවද සංචාරක අංශයේ ඉපැයීම් සහ විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ලැබීම් ඉහළ යෑම මෙන්ම, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම යටතේ පස්වන වාරිකය ලැබීම හේතුවෙන් එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල සුළු වශයෙන් පමණක් අවප්‍රමාණය විය. තවද, ණය සේවාකරණ අවශ්‍යතා සපුරාලන අතර, දළ නිල සංචිත, එ.ජ. ඩොලර් බිලියන 6කට වඩා ඉහළ මට්ටමක පවත්වා ගැනුණි.

2025 වසරේ මේ දක්වා කාලයේ දී දක්නට ලැබුණු වර්ධන වේගය අඛණ්ඩව පවත්වා ගනිමින්, ඉදිරි ආර්ථික දර්ශක මගින් පිළිබිඹු වන පරිදි කෙටි කාලීන ආර්ථික වර්ධනය අපේක්ෂිත වර්ධන මාර්ගය ඔස්සේ ගමන් කරනු ඇත. ප්‍රමාණවත් පරිදි ණය ප්‍රසාරණය වීම, සමස්ත ඉල්ලුම යථා තත්ත්වයට පත් වීම, ව්‍යාපාරික විශ්වාසය වැඩි දියුණු කෙරෙන ස්ථාවර ප්‍රතිපත්ති මෙන්ම ආර්ථිකයේ ව්‍යුහාත්මක ගැටලු විසඳීම සඳහා අඛණ්ඩ ප්‍රතිපත්තිමය ප්‍රයත්න මෙම වර්ධන ප්‍රවණතාවට සහාය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වුවද, වේගයෙන් වෙනස් වන ගෝලීය වෙළඳ තත්ත්වය, ගෝලීය ප්‍රතිපත්ති අවිනිශ්චිතතාව සහ උද්ගත වන භූ දේශපාලනික අර්බුද ආර්ථිකයේ ඉදිරි දැක්ම වෙනස් කිරීමට හේතු විය හැකිය. මැදි කාලීනව ආර්ථික වර්ධනය පවත්වා ගෙන යෑම සහ ආර්ථිකයේ සෑම පාර්ශ්වයකටම සමානව ප්‍රතිලාභ හිමිවන බව සහතික කිරීම පිණිස ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සමඟ වර්ධනය ඉහළ නැංවීම සඳහා වූ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම අවශ්‍ය වේ.

1. මුදල් ප්‍රතිපත්ති සාරාංශය

ශ්‍රී ලංකා මහ බැංකුව 2023 වසරේ ජූනි මස සිට මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කිරීම ඇරඹීමෙන් අනතුරුව ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය අඛණ්ඩව පවත්වාගෙන ගියේය. ඒ අනුව, සාපේක්ෂව මන්දගාමී සමස්ත ඉල්ලුම් තත්ත්ව සහ අඩු උද්ධමන තත්ත්වය මධ්‍යයේ දෙවසරක් පුරා ප්‍රතිපත්ති ලිහිල් කිරීමක් සිදුකර ඇත.

ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට සමගාමීව වෙළඳපොළ පොලී අනුපාතිකවලට තවදුරටත් පහළ යෑමට ඉඩ සලසමින්, 2024 වසරේ නොවැම්බර් මාසයේ දී ප්‍රතිපත්ති පොලී අනුපාතික අඩු කිරීමෙන් පසු මහ බැංකුව කෙටි ප්‍රතිපත්ති විරාමයකට යොමු විය. ඒ අනුව, මහ බැංකුව 2025 වසරේ ජනවාරි සහ මාර්තු මාසවල දී සිය මූලික ප්‍රතිපත්ති පොලී අනුපාතිකය වන එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය නොවෙනස්ව පවත්වා ගත්තේය. බලශක්ති මිල කිහිප වරක් අඩු කිරීම හේතුවෙන් අවධමනකාරී තත්ත්වයක් ඇති වුවද, පුරෝකථනවලට අනුව උද්ධමනය ක්‍රමයෙන් ඉලක්කය වෙත ළඟා වන බව පෙන්නුම් කිරීම පිළිබඳව සලකා බැලීමෙන් අනතුරුව මෙම තීරණයට එළඹිණි. වෙළඳපොළ පොලී අනුපාතික ක්‍රමයෙන් අඩු වීමත් සමඟ ශක්තිමත් ණය වර්ධනය සහ විදේශ අංශය සිය ඔරොත්තු දීමේ හැකියාව පවත්වා ගැනීම මධ්‍යයේ දේශීය ආර්ථික ක්‍රියාකාරකම් ශක්තිමත් ලෙස යථා තත්ත්වයට පත්වීම මෙම මුදල් ප්‍රතිපත්ති වාරය තුළ සිය පොලී අනුපාතික නොවෙනස්ව රඳවා ගැනීමේ මහ බැංකු තීරණයට සහාය විය.

2025 වසරේ මැයි මාසයේ දී, විදුලි ගාස්තු සංශෝධනයට අදාළව ඇති වූ ප්‍රමාදය සහ වර්ධනය වන ගෝලීය අවිනිශ්චිතතා හේතුවෙන් දේශීය ආර්ථිකයට ඇති විය හැකි බලපෑම සැලකිල්ලට ගෙන, පෙර අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා අඩු වේගයකින් උද්ධමනය සාමාන්‍ය අතට හැරීම සිදු වනු ඇතැයි අපේක්ෂා කිරීම හේතුවෙන් මහ බැංකුව එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය පදනම් අංක 25කින් පහළ දමමින් සිය මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය තවදුරටත් ලිහිල් කළේය. එසේම, මෙම කාලය තුළ බොහෝ වෙළඳපොළ ණය පොලී අනුපාතික පහත වැටීමේ වේගය අඩු වීම හේතුවෙන් වෙළඳපොළ පොලී අනුපාතිකවල තවදුරටත් අඩු වීමක් ඇති කරවීමේ අරමුණ ඇතිව මෙම තීරණය ගන්නා ලදී.

මේ අතර, 2025 වසරේ තුන්වන කාර්තුවේ දී උද්ධමනය ධනාත්මක වී එහි ඉලක්කය වෙත ක්‍රමයෙන් යොමු වීමත් සමඟ 2025 වසරේ ජූලි මස පැවති නවතම මුදල් ප්‍රතිපත්ති විවරණයේ දී, එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය නොවෙනස්ව පවත්වා ගැනීමට තීරණය කෙරුණි. ආර්ථිකයේ ඉල්ලුම් තත්ත්ව යථා තත්ත්වයට පත්වීමත් සමඟ මූලික උද්ධමනය ද ක්‍රමයෙන් ඉහළ ගියේය. ප්‍රතිපත්ති පොලී අනුපාතික නොවෙනස්ව පවත්වා ගැනීමේ තීරණයට ශක්තිමත් ආර්ථික වර්ධනය සහ ඉහළ ණය ප්‍රසාරණය තවදුරටත් සහාය වූ අතර, අලුතින් මතු වී ඇති ගෝලීය ප්‍රතිපත්ති අවිනිශ්චිතතා හේතුවෙන් විචක්ෂණශීලී සහ ආරක්ෂාකාරී ප්‍රවේශයක් අනුගමනය කිරීමට අවශ්‍ය විය.

ඒ අනුව, 2023 වසරේ ජූනි මස සිට 2025 වසරේ ජූලි මස දක්වා කාලය තුළ දී මහ බැංකුව සිය ප්‍රතිපත්ති පොලී අනුපාතිකය සමස්තයක් ලෙස ආසන්න වශයෙන් පදනම් අංක 800කින් (ප්‍රතිශතාංක 8.0කින්) පහළ දැමුවේය.

මෙම වසරේ පස්වන මුදල් ප්‍රතිපත්ති විවරණය සඳහා මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය 2025 වසරේ සැප්තැම්බර් මස දී රැස්වෙනු ඇත.

පසුගිය මුදල් ප්‍රතිපත්ති වාර්තාව ප්‍රකාශයට පත් කිරීමේ සිට ගනු ලැබූ මුදල් ප්‍රතිපත්ති තීරණ (2025 පෙබරවාරි – 2025 ජූලි):

2025 මාර්තු	2025 මැයි	2025 ජූලි
එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය 8.00%හි පවත්වාගෙන යන ලදී	එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය 7.75%ක් දක්වා පදනම් අංක 25කින් අඩු කෙරුණි	එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය 7.75%හි පවත්වාගෙන යන ලදී

මුදල් ප්‍රතිපත්ති විවරණ මාධ්‍ය නිවේදන සඳහා QR කේතය භාවිත කරන්න

2. උද්ධමනයේ සහ ආර්ථිකයේ ඉදිරි දැක්ම

උද්ධමනය සහ මූර්ත ආර්ථික වර්ධනය පිළිබඳ පුරෝකථන කෙරෙහි අවධානය යොමු කරමින්, 2025 වසරේ ජූලි මාසයේ දී එළඹුණු මුදල් ප්‍රතිපත්ති තීරණයට සහාය දැක්වීම සඳහා මහ බැංකු කාර්යමණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද මැදි කාලීන සාර්ව ආර්ථික පුරෝකථන මුදල් ප්‍රතිපත්ති වාර්තාවේ මෙම කොටසේ සාරාංශ කර දක්වා ඇත.[3] මෙම පුරෝකථන මගින්, 2025 වසරේ ජූලි මස මුදල් ප්‍රතිපත්ති වාරයේ දී පැවති දත්ත, ප්‍රධාන විචල්‍යයන්හි නුදුරු කාලීන පුරෝකථන, ගෝලීය සාර්ව ආර්ථික පුරෝකථන, සහ උපකල්පන හා විනිශ්චයන් පිළිබිඹු කෙරෙන අතර, මෙම පුරෝකථන මෙම වාර්තාවෙහි *මූලික පුරෝකථන* ලෙස සැලකේ.

2.1. මූලික පුරෝකථන

නවතම නුදුරු කාලීන පුරෝකථනයන්ට අනුව, බලශක්ති හා සම්බන්ධ අවධමනය ලිහිල් වීම පිළිබිඹු කරමින් පවතින අවධමන තත්ත්ව ක්‍රමයෙන් ලිහිල් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2025 වසරේ තෙවන කාර්තුවේ දී උද්ධමනය ධන අගයකට පත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඉල්ලුම් තත්ත්ව ඉහළ යැම මගින් සහාය ලබමින් උද්ධමනය තවදුරටත් ඉහළ ගොස් 2026 වසර මැද භාගය වනවිට 5%ක උද්ධමන ඉලක්කය කරා ළඟා වනු ඇතැයි මැදි කාලීන පුරෝකථන මගින් පෙන්නුම් කෙරේ. ඉන් අනතුරුව, උද්ධමනයේ යම් ඉහළ යෑමක් සිදුවිය හැකි අතර, සුදුසු ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමත් සමඟ උද්ධමනය ඉලක්කගත මට්ටමේ ස්ථායී වීමක් පුරෝකථනය කෙරේ. 2024 වසරේ දී සහ 2025 වසරේ පළමු කාර්තුවේ දී පැවති ධනාත්මක වර්ධනය පවත්වා ගනිමින්, 2025 වසරේ දෙවන කාර්තුව සඳහා මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ (ද.දේ.නි.) වර්ධනය ශක්තිමත් වීමක් නවතම තත්කාලීන පුරෝකථන මගින් අපේක්ෂා කරයි. දැනට පවතින දත්ත අනුව, 2025 වසරේ ආර්ථික වර්ධනය 4.5%ක් පමණ වනු ඇතැයි පුරෝකථනය කෙරේ. ඉදිරි කාලය පිළිබඳ සලකා බැලීමේ දී, ආර්ථිකයේ මධ්‍යස්ථ වර්ධනය මැදි කාලීනව අඛණ්ඩව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වුවද, විදේශීය අංශයේ ඉල්ලුම් තත්ත්ව සහ වෙනස්වන භූ ආර්ථික වාතාවරණය නුදුරු කාලීන සහ මැදි කාලීන ආර්ථික වර්ධන ඉදිරි දැක්ම හා සම්බන්ධ අවිනිශ්චිතතාව ඉහළ නංවයි.

උද්ධමනය පිළිබඳ ඉදිරි දැක්ම[4]

2025 වසරේ පළමු කාර්තුවේ දී ඉහළම අවධමන මට්ටම වාර්තා වීමේ සිට, පෙර පුරෝකථනය කළ පරිදි අවධමන තත්ත්වයේ ලිහිල් වීමක් ආරම්භ වී ඇත. 2025 වසරේ දෙවන කාර්තුව තුළ මෙම ලිහිල් වීමේ ප්‍රවණතාවය සඳහා ආහාර මිල ගණන් ඉහළ යැම හේතු විය. මේ අතර, 2025 වසරේ ජූනි මාසයේ දී විදුලි ගාස්තු ඉහළ දැමීම ද අවධමන මට්ටම ලිහිල් වීමට දායකත්වය සැපයූ අතර එහි බලපෑම 2025 වසරේ තෙවන කාර්තුවේ දී ද පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඊට අමතරව, 2025 වසරේ තෙවන කාර්තුවේ දී මෙම ප්‍රවණතාව සඳහා සංඛ්‍යානමය පදනම් බලපෑම ද දායක වනු ඇතැයි අපේක්ෂා කෙරේ. අනුක්‍රමික කාර්තු තුනක දී අඛණ්ඩ අවධමනයක් වාර්තා වීමෙන් අනතුරුව, 2025 වසරේ තෙවන කාර්තුවේ දී උද්ධමන තත්ත්වයක් කරා ළඟා වීමක් සහ 2025 වසරේ සිව්වන කාර්තුවේ දී උද්ධමනය තවදුරටත් ඉහළ යැමක් අපේක්ෂා කෙරේ. මැදි කාලීන පුරෝකථනය අනුව,

---

[3] මැදි කාලීන සාර්ව ආර්ථික පුරෝකථන සිදු කිරීම සඳහා මහ බැංකුව විසින් අර්ධ ව්‍යුහාත්මක සාර්ව ආර්ථික ආකෘතියක් වන කාර්තුමය පුරෝකථන ආකෘතිය (Quarterly Projection Model) භාවිත කරනු ලැබේ. සෑම මුදල් ප්‍රතිපත්ති වාරයකදීම මෙම පුරෝකථන යාවත්කාලීන කරනු ලබන අතර, ඒ සඳහා, වෙනත් මූලාශ්‍ර අතර, ගෝලීය සාර්ව ආර්ථික පුරෝකථන සහ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන මාසික උද්ධමන දත්ත සහ දළ දේශීය නිෂ්පාදිතයේ කාර්තුමය දත්ත ද ඇතුළුව, නවතම ආර්ථික ප්‍රවණතා පිළිබඳ දත්ත සහ තොරතුරු භාවිත කෙරේ.

[4] මතුපිට උද්ධමනය කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද., 2021=100) මත පදනම්ව මනිනු ලැබේ.

2026 වසරේ මැද භාගය වනවිට මතුපිට උද්ධමනය ඉලක්කගත මට්ටමට ළඟාවනු ඇතැයි පුරෝකථන කෙරේ. ඉලක්කගත මට්ටමට වඩා තාවකාලික ඉහළ යෑමක් වාර්තා කරමින් 2026 වසරේ දෙවන අර්ධය දක්වා මෙම උද්ධමනය ඉහළ යෑමේ ප්‍රවණතාව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වුවද, ඉන් අනතුරුව, සුදුසු මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල සහාය ඇතිව උද්ධමනය ක්‍රමයෙන් ඉලක්කගත 5%ක මට්ටමට ළඟා වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඉල්ලුම් තත්ත්ව ක්‍රමයෙන් යථා තත්ත්වට පත්වීම සහ දීර්ඝ කාලයක් පැවති අවධමන තත්ත්වයකින් පසුව අපේක්ෂිත බලශක්ති සහ ප්‍රවාහන උද්ධමනය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත් වීම සමස්තයක් ලෙස උද්ධමනය ඉහළ යෑමට හේතු විය හැකිය. කෙසේ වුවද, වෙනස්වන ගෝලීය සාර්ව ආර්ථික තත්ත්ව මැදි කාලීන පුරෝකථන හා සම්බන්ධ අවිනිශ්චිතතාව ඉහළ නංවයි.

02 රූප සටහන: මතුපිට උද්ධමනයේ පුරෝකථනය (කාර්තුමය, කො.පා.මි.ද., වාර්ෂික ලක්ෂ්‍යමය, %)
2025 වසරේ ජූලි මස මුදල් ප්‍රතිපත්ති වාරයේ පුරෝකථන මත පදනම්ව



***2023 වසරේ ඔක්තෝබර් මාසයේ දී මහ බැංකුව සහ මුදල් අමාත්‍යවරයා අතර අත්සන් කරන ලද මුදල් ප්‍රතිපත්ති රාමුව පිළිබඳ ගිවිසුම යටතේ උද්ධමන ඉලක්කය (5%) සඳහා එකඟ වී ඇත.*

සටහන: උද්ධමන ව්‍යාප්ති සටහනෙහි වාර්තා කරන ලද දත්ත කො.පා.මි.ද. (2021=100, ඍතුමය වශයෙන් ඇතිවන බලපෑම් ඉවත් කරන ලද (seasonally adjusted)) මත පදනම් වේ.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකු කාර්යමණ්ඩල පුරෝකථන

සටහන: පුරෝකථනයක් යනු පොරොන්දුවක් හෝ බැඳීමක් නොවේ

2025 වසරේ ජූලි මාසයේ මුදල් ප්‍රතිපත්ති වාරයේ දී පැවති දත්ත, උපකල්පන සහ විනිශ්චයන් පුරෝකථන මගින් පිළිබිඹු කරයි. ගෝලීය බලශක්ති සහ ආහාර මිල පිළිබඳ වන පුරෝකථන; ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වන ශ්‍රී ලංකාවේ ප්‍රධාන වෙළඳ හවුල්කරුවන්ගේ ආර්ථික වර්ධනය; රජයේ අපේක්ෂිත රාජ්‍ය මූල්‍ය ඉදිරි දැක්ම; සහ එක්සත් ජනපද මුදල් ප්‍රතිපත්ති පොලී අනුපාතිකය මගින් නිරූපණය වන ගෝලීය මූල්‍ය තත්ත්ව යනාදී කරුණු මත මෙම පුරෝකථන රඳා පවතී. තවද, ආර්ථික ආකෘති සමඟ අනුකූල වන පොලී අනුපාතික මාර්ගය සහ විනිමය අනුපාතිකය ද ඇතුළු සාර්ව ආර්ථික විචල්‍යයන්හි හැසිරීම මත පුරෝකථන රඳා පවතී. තවද, මූලික පුරෝකථනවල දී ප්‍රධාන සාර්ව ආර්ථික ප්‍රතිපත්තිවලින් විශාල වශයෙන් විතැන් වීමක් අපේක්ෂා නොකෙරේ. එබැවින්, ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන අඛණ්ඩව පවත්වාගෙන යෑම සහ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ප්‍රයත්න මෙයට අදාළ වේ. මෙම උපකල්පනවල සිදුවන සැලකිය යුතු මට්ටමේ වෙනස්කම් සැබෑ උද්ධමනය පුරෝකථනය කළ මාර්ගයෙන් අපගමනය වීමට හේතු විය හැකිය. මැදි කාලීන සාර්ව ආර්ථික පුරෝකථන, උද්ධමන ව්‍යාප්ති සටහන් සමඟින්, එක් එක් මුදල් ප්‍රතිපත්ති වාරය තුළ අඛණ්ඩව යාවත්කාලීන කෙරේ. අස්ථාවර ගෝලීය පරිසරය සහ දේශීය ආර්ථිකයේ ඇති අවිනිශ්චිතතා සැලකිල්ලට ගනිමින්, මූලික පුරෝකථන, පුරෝකථනය කරන ලද මට්ටම්වලට වඩා ඉහළ යෑම සඳහා මෙන්ම පහළ යෑම සඳහා අවදානම් පැවතිය හැකිය. මූලික පුරෝකථනයට ඇති අවදානම් පිළිබඳ විස්තර "මූලික පුරෝකථන මත පවතින අවදානම්" කොටසේ දී සාකච්ඡා කෙරේ.

මූලික උද්ධමනය ද නුදුරු කාලීනව ක්‍රමයෙන් ඉහළ යෑමක් වාර්තා වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මැදි කාලීනව මූලික උද්ධමනය මතුපිට උද්ධමනයට වඩා අඩු උච්චාවචනයක් සහිතව 5%ක මතුපිට උද්ධමන ඉලක්කයට අනුකූල මට්ටමක ස්ථායී වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඉල්ලුම් තත්ත්වයන්ගේ අපේක්ෂිත යථා තත්ත්වයට පත් වීම සහ ගෝලීය ආහාර මිල ගණන් හා ගෝලීය උද්ධමන ප්‍රවණතාවල අර්ධ වශයෙන් වන බලපෑමෙන් ඇතිවන ආනයන උද්ධමනය හේතුවෙන්, මූලික උද්ධමනය ඉදිරි කාලයේ දී ක්‍රමයෙන් මතුපිට උද්ධමන ඉලක්කය කරා ඉහළ යනු ඇතැයි පුරෝකථනය කෙරේ. ඒ අනුව, ගෝලීය උද්ධමන ප්‍රවණතා හා සම්බන්ධ පුරෝකථන පිළිබඳව පවතින අවිනිශ්චිතතාව මූලික උද්ධමන පුරෝකථන සඳහා ද යම්තාක් දුරකට බලපෑම් කළ හැකිය.

03 රූප සටහන: මූලික උද්ධමනයේ පුරෝකථනය (කාර්තුමය, කො.පා.මි.ද., වාර්ෂික ලක්ෂ්‍යමය, %)
2025 වසරේ ජූලි මස මුදල් ප්‍රතිපත්ති වාරයේ පුරෝකථන මත පදනම්ව



සටහන: උද්ධමන ව්‍යාප්ති සටහනෙහි වාර්තා කරන ලද දත්ත කො.පා.මි.ද. (2021=100, ඍතුමය වශයෙන් ඇතිවන බලපෑම් ඉවත් කරන ලද (seasonally adjusted)) මත පදනම් වේ.
ඉහත 02 රූප සටහනෙහි පැහැදිලි කිරීමේ සටහන බලන්න.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකු කාර්යමණ්ඩල පුරෝකථන

ඉලක්කගත මට්ටම කරා මතුපිට උද්ධමනයේ ඉහළ යෑමකට දායක වෙමින්, මැදි කාලීනව බලශක්ති හා ප්‍රවාහන අවධමනය තවදුරටත් ලිහිල් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද, නුදුරු කාලීනව ගෝලීය බනිජතෙල් මිලෙහි අපේක්ෂිත තාවකාලික ඉහළ යෑම ද බලශක්ති සහ ප්‍රවාහන උද්ධමනය ඉහළ යෑමට දායක විය හැකිය. කෙසේ වුවද, වෙනස්වන ගෝලීය සාර්ව ආර්ථික තත්ත්ව ගෝලීය බනිජතෙල් මිල පිළිබඳ ඉදිරි දැක්ම හා සම්බන්ධ අවිනිශ්චිතතාව ඉහළ නංවයි. සැපයුම් හා සම්බන්ධ සාධක හේතුවෙන් මෑත කාලීනව නිතර මිල උච්චාවචනය වන ආහාර උද්ධමනය ඉහළ ගිය අතර, එය සරු අස්වැන්නක් ලැබීම හේතුවෙන් නුදුරු කාලීනව පහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වුවද, ක්ෂණිකව වෙනස්වන කාලගුණ තත්ත්ව හේතුවෙන් ඇතිවන බලපෑම් වැනි සැපයුම් හා සම්බන්ධ සාධක නිතර මිල උච්චාවචනය වන ආහාර උද්ධමනයට අඛණ්ඩව බලපෑම් එල්ල කරනු ඇත. එසේ වුවත්, එවැනි සාධකවල ඇති අහඹු ස්වභාවය හේතුවෙන් ඒවා පුරෝකථනවලට යොදා නොගන්නා හෙයින් ඒවා මෙම පුරෝකථන සාක්ෂාත් කර ගැනීම හා සම්බන්ධ අවදානම්වලට අදාළ කර ගැනේ.

04 රූප සටහන: මතුපිට උද්ධමනය: මිලෙහි ගතික බලපෑම හා පදනම් බලපෑම (කො.පා.මි.ද., 2021=100)



සටහන: ගතිකතාව සහ පදනම් බලපෑම පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා විශේෂ සටහන (අ) බලන්න.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකු කාර්යමණ්ඩල ගණනය කිරීම්

උද්ධමන අපේක්ෂා

මහ බැංකුවේ උද්ධමන අපේක්ෂා පිළිබඳ සමීක්ෂණයට අනුව, ආයතනික අංශයේ කෙටි කාලීන උද්ධමන අපේක්ෂා සමස්තයක් ලෙස වාර්තා වූ උද්ධමනයට අනුකූලව පැවතුණි. ඒ අනුව, ඉදිරි මාස 3ක සහ 6ක උද්ධමන අපේක්ෂා 2025 වසරේ ජනවාරි සිට මාර්තු දක්වා සමස්තයක් ලෙස පහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළ අතර ඉන් අනතුරුව ඉහළ ගියේය. 2025 වසරේ ජූලි මාසයේ සමීක්ෂණ වාරයට අනුව, අවධමන පීඩන ලිහිල් වීමත් සමඟ අපේක්ෂිත උද්ධමනයේ ක්‍රමික වර්ධනයක් ඉදිරි මාස 3ක කාලයේ සිට දිගු කාල සීමාවක් දක්වා නිරීක්ෂණය කළ හැකිය. තවද, ආයතනික අංශයේ මැදි කාලීන උද්ධමන අපේක්ෂා සමස්තයක් ලෙස මහ බැංකුවේ උද්ධමන පුරෝකථන සහ 5%ක උද්ධමන ඉලක්කය සමඟ අනුකූලව පවතී.

විශේෂ සටහන (අ): මිලෙහි ගතික බලපෑම සහ පදනම් බලපෑම පිළිබඳ දැනුම්වත් වීම[1]

යම් කිසි කාලපරිච්ඡේදයක උද්ධමනය සාමාන්‍යයෙන් මනිනු ලබන්නේ පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට (වාර්ෂික ලක්ෂ්‍යමය) සාපේක්ෂව පොදු මිල මට්ටමේ ප්‍රතිශත වෙනස ලෙසයි. පොදු මිල මට්ටම පාරිභෝගික මිල දර්ශකයක් මගින් මනිනු ලබයි (ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් සැලකූ විට, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකාවේ උද්ධමනය මැනීමට භාවිතා කරන ප්‍රධාන මිල දර්ශක දෙක වන කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද.) සහ ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද.) සම්පාදනය කර ප්‍රකාශයට පත් කරයි). කෙසේ වුවද, මිල තොරතුරු සාමාන්‍යයෙන් මාසිකව ප්‍රකාශයට පත් කරන බැවින් මාසික ලක්ෂ්‍යමය පදනමින් ද මිල වෙනස් වීම ගණනය කළ හැකිය (එනම් මාසයෙන් මාසයට ගණනය කරනු ලබන වෙනස් වීම් ලෙස).

වත්මන් මාසයේ මාසික ලක්ෂ්‍යමය උද්ධමනය ගතිකතාව (momentum) ලෙස හඳුන්වන අතර, පෙර වසරේ අනුරූප මාසයේ මාසික ලක්ෂ්‍යමය උද්ධමනයේ ඍණ අගය වත්මන් මාසයේ දී පදනම් බලපෑම (base effect) ලෙස හැඳින්වේ. ගතිකතාව මගින් වත්මන් මාසයේ මිල ප්‍රවණතා හේතුවෙන් වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය වෙනස් වී ඇති ආකාරය නිරූපණය කරන අතර, පදනම් බලපෑම් මගින් වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය එක් මාසයක සිට ඊළඟ මාසය දක්වා වෙනස්වීම කෙරෙහි වන සංඛ්‍යානමය බලපෑම නිරූපණය වේ. එක් මාසයක සිට ඊළඟ මාසය දක්වා වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය වෙනස් වීම ගතිකතාව සහ පදනම් බලපෑම එකතු කිරීමෙන් ආසන්න වශයෙන් ගණනය කළ හැකිය.[2] එනම්, පෙර මාසයේ වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනයට ගතිකතාව සහ පදනම් බලපෑම එකතු කිරීමෙන් වත්මන් මාසයේ වාර්ෂික ලක්ෂමය උද්ධමනය ගණනය කළ හැකිය (එනම්, $\pi_t^{\text{වාර්ෂික ලක්ෂ්‍යමය}} \approx \pi_{t-1}^{\text{වාර්ෂික ලක්ෂ්‍යමය}} +$ ගතිකතාව $+$පදනම් බලපෑම, මෙහි π මගින් උද්ධමනය නිරූපණය වේ). මෙම වෙන් කිරීම විශ්ලේෂකයින්ට වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනයේ වෙනස්වීම්වලට දායක වන ප්‍රධාන සාධක ඇගයීමට ඉඩ සලසයි.

උද්ධමනය කෙරෙහි ගතිකතාව සහ පදනම් බලපෑම අතර වන සම්බන්ධය අ.1. රූප සටහන මගින් තවදුරටත් පැහැදිලි කළ හැකිය. මෙම උපකල්පිත නිදසුනෙහි, රටක මිල මට්ටම සෑම මසකම 0.5%කින් අඛණ්ඩව ඉහළ යන අවස්ථාවක් පෙන්නුම් කරයි. එනම්, මාසික ලක්ෂ්‍යමය උද්ධමනය 0.5%ක් ලෙස නොවෙනස්ව පවතී. මෙය සෑම මසකම 6%ක ස්ථාවර වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනයක් වාර්තා වීමට හේතු වේ. මෙම අවස්ථාවේ දී මිල ඉහළ යෑමේ වේගය දිගටම නොවෙනස්ව පැවතීම හේතුවෙන් සෑම මාසයකම ගතිකතාව සහ පදනම් බලපෑම එකම අගයක් ගන්නා අතර, ඒවායේ බලපෑම එකිනෙකට අහෝසි වීම මගින් වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය නොවෙනස්ව පවතී. මිල මට්ටම් මේ ආකාරයෙන් හැසිරෙමින් පවතින අතරතුර දෙවන වසරේ පස්වන මාසයේ දී මාසික ලක්ෂ්‍යමය උද්ධමනය ක්ෂණිකව 3.5% ක් දක්වා ඉහළ ගොස් ඊට පසු මාසයේ සිට නැවතත් 0.5%ක මාසික ලක්ෂ්‍යමය උද්ධමනයක් ලෙස වාර්තා වීමක් උපකල්පනය කරමු. ඒ අනුව, නවතම ගතිකතාව 3.5%ක් වන අතර පදනම් බලපෑම 0.5%ක නොවෙනස්ව පැවතීම හේතුවෙන්, දෙවන වසරේ පස්වන මාසයේ වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය 3.0%කින් පමණ ඉහළ යන බව නිරීක්ෂණය කෙරේ. ඉන්පසු මාසයේ සිට ගතිකතාව සහ පදනම් බලපෑම නැවතත් සමාන වීමත් සමඟ වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය මෙම ඉහළ මට්ටමේ නොවෙනස්ව පවතින බව තවදුරටත් පැහැදිලි වේ. කෙසේ වුවද, වසරක් අවසාන වනවිට (එනම්, තුන්වන වසරේ පස්වන මාසයේ දී), වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය ඉහළ යෑමට දායක වූ ගතිකතාව පදනම් බලපෑමක් බවට පත් වන අතර, වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය 3.0%කින් අඩු වීමට හේතු වේ. පදනම් බලපෑම, වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනයේ පළමු වෙනස ආපසු හරවමින් මාස 12කට පසුව එම බලපෑම තුලනය කිරීමක් ලෙස පැහැදිලි වේ.

මෙම උපකල්පිත නිදසුන සමාන මාසික මිල ගණන් ඉහළ යෑම් උපකල්පනය කරමින් ගතිකතාවයේ සහ පදනම් බලපෑමේ ස්වභාවය සරලව පෙන්නුම් කිරීමට යොදා ගනු ලැබුව ද, මෙම මුදල් ප්‍රතිපත්ති වාර්තාවේ 04 රූප සටහන මගින් දක්වා ඇති පරිදි, සැබෑ තත්ත්වයේ දී මාසික මිල වෙනස් වීම් නිරන්තරයෙන් උච්චාවචනය වන බැවින් ගතිකතාව සහ පදනම් බලපෑම විවිධ මට්ටම්වලින් වාර්තා වීම සාමාන්‍ය ස්වභාවයයි.

අ.1 රූප සටහන: උපකල්පිත නිදසුන: මිලෙහි ගතික බලපෑම හා පදනම් බලපෑම වෙනස්වීම



සටහන: ප්‍රතිශත වෙනස ලඝු අගයන්හි වෙනස්වීම මත පදනම් වේ

මූලය: මහ බැංකු කාර්යමණ්ඩල ගණනය කිරීම්

[1] වඩාත් සවිස්තරාත්මක තොරතුරු සඳහා, "ශ්‍රී ලංකාවේ නිර්-උද්ධමන (උද්ධමනය පහළ යෑමේ) ක්‍රියාවලිය" යන විශේෂ සටහනට මහ බැංකු වෙබ් අඩවිය හරහා ප්‍රවේශ විය හැකිය.

[2] යම් විචල්‍යයක ප්‍රතිශත වෙනස්වීම, එහි ලඝු අගයන්හී වෙනස්වීම මගින් ආසන්න වශයෙන් ගණනය කළ හැකි වීම මෙම තර්කනය සඳහා මූලික වේ.

මූර්ත ආර්ථික වර්ධනය පිළිබඳ ඉදිරි දැක්ම

පවතින දර්ශක, සමීක්ෂණ ප්‍රතිඵල සහ කාර්යමණ්ඩල ඇගයීම් මත පදනම්ව, ආර්ථික වර්ධනය පිළිබඳ තත්කාලීන සහ නුදුරු කාලීන පුරෝකථන මගින්, 2024 වසරේ සහ 2025 වසරේ පළමු කාර්තුවේ නිරීක්ෂණය කරන ලද ධනාත්මක වර්ධනය අඛණ්ඩව පවත්වා ගනිමින් 2025 වසරේ දෙවන කාර්තුවේ දී ද මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය ශක්තිමත් වනු ඇතැයි පෙන්නුම් කෙරේ. ප්‍රධාන වශයෙන් මේ සඳහා කර්මාන්ත සහ කෘෂිකාර්මික අංශයේ ක්‍රියාකාරකම්හි ධනාත්මක වර්ධනය දායක වී ඇත. තවද, අංශ තුනෙහිම අපේක්ෂා කරන ධනාත්මක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධන සමඟ 2025 තුන්වන කාර්තුව සඳහා ද මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය ශක්තිමත් වනු ඇතැයි පුරෝකථනය කෙරේ. කෙසේ වෙතත්, පවත්නා ගෝලීය වෙළඳ අවිනිශ්චිතතා සහ වෙනස් වන භූ දේශපාලනික තත්ත්ව හේතුවෙන් ඉහළ වර්ධන තත්ත්වයට බලපෑම් ඇති විය හැකිය.[5]

මැදි කාලීනව ආර්ථිකය මධ්‍යස්ථ වර්ධනයක් පවත්වා ගනු ඇතැයි අපේක්ෂා කෙරේ. සාපේක්ෂ වශයෙන් ලිහිල් මුදල් තත්ත්ව මෙම මධ්‍යස්ථ වර්ධනයට දායකත්වය සපයයි. සමස්ත ඉල්ලුම යථා තත්ත්වයට පත්වීම නිරූපණය කරමින් නිමැවුම් පරතරය අඩු ධනාත්මක මට්ටම් කරා ක්‍රමයෙන් ළඟා වීමක් මැදි කාලීනව අපේක්ෂා කෙරේ. කෙසේ වුවද, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ප්‍රයත්න සමඟ සමස්ත ඉල්ලුම ස්ථාවර කිරීමට සහාය වෙමින් මැදි කාලීනව රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය දැඩි වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතර, ධනාත්මක විදේශ නිමැවුම් පරතරය අඩු වී සෘණ මට්ටමකට පත්වනු ඇතැයි ඇස්තමේන්තු කෙරේ. ප්‍රධාන වශයෙන්, එක්සත් ජනපද වෙළඳ ප්‍රතිපත්ති හේතුවෙන් විදේශ ඉල්ලුමේ අඩු වීමක් පෙන්නුම් කරමින් මැදි කාලීනව මෙම සෘණාත්මක නිමැවුම් පරතරය අඛණ්ඩව පවතිනු ඇතැයි පුරෝකථනය කෙරේ.

පුරෝකථනය කරන ලද මැදි කාලීන ආර්ථික වර්ධන මාර්ගය සැලකිය යුතු අවිනිශ්චිතතාවයකට ලක්ව තිබීම අවධාරණය කළ යුතු කරුණකි. ආර්ථිකය සැලකිය යුතු ලෙස අඛණ්ඩව යථා තත්ත්වයට පත් වීම ඉලක්කගත ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සහ වර්ධන උපායමාර්ග කඩිනම්ව සහ ඵලදායීව ක්‍රියාවට නැංවීම මත රඳා පවතී. දූෂණ අවදානම් විසඳීමට අඛණ්ඩව පියවර ගැනීම ආයෝජකයින්ගේ විශ්වාසය ශක්තිමත් කර ගැනීම සහ පෞද්ගලික අංශය විසින් මෙහෙයවනු ලබන දිගු කාලීන සහ තිරසාර ආර්ථික සංවර්ධනයකට හිතකර වන පරිසරයක් නිර්මාණය කිරීම සඳහා අත්‍යවශ්‍ය වනු ඇත. මෙම වාතාවරණය තිරසාර ආර්ථික වර්ධනයක් පවත්වා ගැනීම සඳහා තීරණාත්මක වන, දේශීය සහ විදේශීය යන දෙඅංශයෙන්ම ඉතුරුම්වල සහාය ඇතිව ආයෝජන අංශයේ ස්ථාවර වර්ධනයක් නිර්මාණය කිරීම සඳහා සහාය වනු ඇත.

---

[5] නවතම තොරතුරුවලට අනුව, එක්සත් ජනපදය විසින් ශ්‍රී ලංකා අපනයන සඳහා 20%ක තීරු බද්දක් පනවා තිබේ.

05 රූප සටහන: කාර්තුමය මූර්ත ද.දේ.නි.යේ වර්ධනයෙහි පුරෝකථන (වාර්ෂික ලක්ෂ්‍යමය, %)
2025 වසරේ ජූලි මස මුදල් ප්‍රතිපත්ති වාරයේ පුරෝකථන මත පදනම්ව



ඉහත 02 රූප සටහනෙහි පැහැදිලි කිරීමේ සටහන බලන්න.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකු කාර්යමණ්ඩල පුරෝකථන

2.2. පුරෝකථන සඳහා පාදක වන ප්‍රධාන උපකල්පන

2025 ජූලි මස මුදල් ප්‍රතිපත්ති වාරයේ දී එළඹුණු මැදි කාලීන පුරෝකථන සඳහා භාවිත කරන ලද ප්‍රධාන උපකල්පනවල සාරාංශයක් මෙම කොටසේ දක්වා ඇත.

ගෝලීය පරිසරය

එක්සත් ජනපද අන්‍යෝන්‍ය තීරු බදු නිවේදනය කිරීමත් සමඟ ගෝලීය වෙළඳපොළෙහි කැළඹීම් ඇති වූ අතර, එය ලොවපුරා ආර්ථික අවිනිශ්චිතතාව ඉහළ දැමීය. ඉහළ ගිය අවිනිශ්චිතතා සහ පවතින භූ දේශපාලනික ගැටුම් හේතුවෙන් ලෝක ආර්ථික වර්ධනය පහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඉහළ ගිය ගෝලීය සැපයුම් දාම හා වෙළඳ අවහිරතා, සහ භූ දේශපාලනික ගැටුම් හා සම්බන්ධ භාණ්ඩ මිල උච්චාවචන හේතුවෙන් පවත්නා නිර්-උද්ධමන ක්‍රියාවලිය මන්දගාමී වනු ඇතැයි අපේක්ෂා කරන අතර එමගින් මහ බැංකු විසින් පොලී අනුපාතික පහළ දැමීමේ වේගය නැවත සලකා බැලීමට සිදු වනු ඇත. Global Projections Model Network (GPMN)[6] හි පුරෝකථනයට අනුව, අපනයන අනුව බර තබන ලද විදේශ නිමැවුම් පරතරය[7] ශීඝ්‍ර ලෙස පහළ ගොස් නුදුරු කාලයේ දී සෘණ අගයක් ගනු ඇතැයි පුරෝකථනය කර ඇති අතර, එක්සත් ජනපදය සහ යුරෝ කලාපීය ආර්ථිකයන්හි අපේක්ෂිත මන්දගාමීත්වය හේතුවෙන් මෙම නිමැවුම් පරතරය මැදි කාලීනව පහළ මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. එක්සත් ජනපද පාරිභෝගික මිල දර්ශකය මත පදනම් වූ උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය) 2025 වසරේ පළමු භාගයේ දී 2.6%ක පමණ මට්ටමේ පැවතුණි. කෙසේ වෙතත්, භාණ්ඩ උද්ධමනය ඉහළ යෑම, අපේක්ෂිත ඉහළ

[6] මහ බැංකුව මැදි කාලීන පුරෝකථන සිදු කිරීම සඳහා GPMN විසින් සකස් කරන ලද ගෝලීය සාර්ව ආර්ථික දර්ශකවල පුරෝකථන භාවිතා කරයි. 2025 වසරේ ජූලි මස මුදල් ප්‍රතිපත්ති වාරයේ දී භාවිතා කරන ලද පුරෝකථන 2025 වසරේ ජූනි 25 දින GPMN මගින් ලබා දුන් පුරෝකථන මත පදනම් වී ඇත.

[7] ශ්‍රී ලංකාවේ ප්‍රධාන වෙළඳ හවුල්කරුවන් හය දෙනෙකුට අනුරූප වන සමස්ත අපනයනයේ ප්‍රමතකරණය කරන ලද අනුපාත භාවිතා කර GPMN පුරෝකථනයන්හි සපයා ඇති වෙළඳ හවුල්කරුවන්ගේ නිමැවුම් පරතරවල බරිත සාමාන්‍ය නිමැවුම් පරතරයක් ලෙස අපනයනය අනුව බර තබන ලද විදේශ නිමැවුම් පරතරය ගණනය කෙරේ.

බලශක්ති මිල සහ තීරුබදු බලපෑම සමඟ එක්සත් ජනපද උද්ධමනය නුදුරු මාසවල දී උද්ධමන ඉලක්කයට වඩා මදක් ඉහළින් පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. එක්සත් ජනපද මුදල් ප්‍රතිපත්ති පොලී අනුපාතිකයෙහි ක්‍රමයෙන් පහළ දැමීමක් අපේක්ෂා කරයි. ඊශ්‍රායල - ඉරාන - එක්සත් ජනපද යුද ගැටුම හා සම්බන්ධ භූ දේශපාලනික අර්බුද හේතුවෙන් බ්‍රෙන්ට් බොරතෙල් මිල මුල් කාලයේ දී ඉහළ ගිය ද, අර්බුදකාරී තත්ත්වය සමනය වීමත් සමඟ බොරතෙල් මිල වේගයෙන් අඩු විය. ඛනිජතෙල් අපනයනය කරන රටවල සංවිධානයෙහි (OPEC+) නිෂ්පාදනයේ අඛණ්ඩ වැඩි වීම සහ ගෝලීය ඉල්ලුම මන්දගාමී වීම හේතුවෙන්, GPMN පුරෝකථනවලට අනුව, බ්‍රෙන්ට් බොරතෙල් මිලෙහි සාමාන්‍ය අගය පෙර වසරට සාපේක්ෂව 2025 වසරේ දී අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඉදිරි වසරවල දී ගෝලීය ආහාර උද්ධමනය සමස්තයක් ලෙස ස්ථායීව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

රාජ්‍ය මූල්‍ය අංශයේ ගමන් මග

2025 ජූනි මස මුදල් අමාත්‍යාංශය විසින් ප්‍රකාශයට පත් කළ 2026 වසර සඳහා වන රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශයට අනුව, වත්මන් පුරෝකථනවල ඇතුළත් කර ඇති රාජ්‍ය මූල්‍ය අංශයේ ගමන් මග හා සම්බන්ධ උපකල්පන යාවත්කාලීන කර ඇත.

විදේශීය ජංගම ගිණුම

2025 මුල් මාස පහ තුළ දී වාර්තා වූ සැලකිය යුතු ඉහළ අතිරික්තය හේතුවෙන්, 2025 වසර සඳහා විදේශීය ජංගම ගිණුමේ අතිරික්තයක් පුරෝකථනය කෙරේ.

2.3. මූලික පුරෝකථන මත පවතින අවදානම්

වාර්තා විය හැකි උද්ධමනය සහ දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය, ඒවායේ මූලික පුරෝකථන මට්ටම්වලට වඩා ඉහළ යෑම සඳහා මෙන්ම පහළ යෑම සඳහා ද අවදානම් පවතී. 2025 වසරේ ජූලි මාසයේ මුදල් ප්‍රතිපත්ති වාරයට අනුව, එවැනි අවදානම් පිළිබඳ විවරණයක් මෙම කොටසේ දක්වා ඇත.

උද්ධමන පුරෝකථන මත පවතින අවදානම්

උද්ධමනය පුරෝකථනය කළ මට්ටමට වඩා ඉහළ යෑම සඳහා අවදානම් කිහිපයක් හේතු විය හැකිය. භූ දේශපාලනික අර්බුද සහ සැපයුම් අංශයේ බාධාවන් මගින් භාණ්ඩ මිල කෙරෙහි ඇති කරන බලපෑම දැනටමත් ගෝලීය තෙල් මිල සහ විදේශ නිමැවුම් පරතරය වැනි දර්ශකවල යම් ප්‍රමාණයකට ඇතුළත් කර තිබේ. කෙසේ වෙතත්, ගෝලීය භූ දේශපාලනික සහ සාර්ව ආර්ථික තත්ත්ව අසාමාන්‍ය ලෙස උච්චාවචනය වන බැවින්, ගෝලීය වෙළඳ භාණ්ඩ මිල ගණන් තවදුරටත් ඉහළ යෑමේ බලපෑම් සහ උච්චාවචනය වීම් ඇති විය හැකි ය. 2025 වසරේ ශ්‍රී ලංකා රුපියල ක්‍රමයෙන් අවප්‍රමාණය වීමක් මූලික පුරෝකථන උපකල්පනය කරයි. මූලික පුරෝකථන සඳහා සලකා බැලූ මට්ටම ඉක්මවා අවප්‍රමාණය වීමක් සිදු වුවහොත් එය උද්ධමන පීඩනවලට හේතු විය හැකිය. ඉල්ලුම් පීඩන ක්‍රමයෙන් වැඩි වීම ඉදිරි කාලය තුළ දී උද්ධමනය අපේක්ෂිත යථා තත්ත්වයට පත්වීමට බලපාන වැදගත් සාධකයක් ලෙස පවතී. මෑත කාලීන මාසවල දී ඉහළ ණය ප්‍රසාරණයක් පෙන්නුම් කර ඇති අතර, ණය තවදුරටත් අඛණ්ඩව ප්‍රසාරණය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. පෞද්ගලික අංශයට ලබා දෙන ණය වර්ධනයේ වේගවත් ඉහළ යෑමක් ඉල්ලුම් පීඩන අපේක්ෂා කළ මට්ටමට වඩා වැඩි වීමට හේතු විය හැකිය. තවද, මෑත කාලයේ නිරීක්ෂණය කරන ලද අනපේක්ෂිත කාලගුණ වෙනස්වීම් මධ්‍යයේ කෘෂිකාර්මික නිෂ්පාදනයට අහිතකර

ලෙස බලපෑ හැකි අයහපත් කාලගුණික තත්ත්ව හේතුවෙන් ආහාර උද්ධමනය ඉහළ යෑමේ බලපෑම් ඇති කළ හැකිය. එසේම, දේශගුණික වෙනස්වීම් සමඟ ඇතිවිය හැකි කාලගුණික වෙනස්වීම් ද බලශක්ති උත්පාදනය සඳහා ජල විදුලිය නිෂ්පාදනය සහ කෘෂිකාර්මික කටයුතු කෙරෙහි බලපෑ හැකි බැවින් බලශක්ති සහ ආහාර මිල ඉහළ යෑමේ අවදානම් ඇති කරයි.

උද්ධමනය පුරෝකථනය කළ මට්ටමට වඩා පහළ යෑමේ අවදානම් සැලකූ විට, නුදුරු කාලයේ දී ඉහළ අස්වැන්න හේතුවෙන් ආහාර මිලෙහි තවදුරටත් පහළ යෑම් ඇති විය හැකිය. තවද, භූ දේශපාලනික අර්බුද සහ තීරු බදු ඉහළ යෑම හේතුවෙන් ඇති විය හැකි ගෝලීය ඉල්ලුමෙහි අඛණ්ඩ මන්දගාමී වීම අපේක්ෂා කළ මට්ටමට වඩා බලශක්ති සහ ආහාර මිල ගණන් පහළ යෑමට හේතු විය හැකිය.

වත්මන් මුදල් ප්‍රතිපත්ති වාරයේ විනිශ්චයන්ට අනුව, උද්ධමන පුරෝකථන සඳහා ඇති අවදානම් නුදුරු කාලීනව මෙන්ම මැදි කාලීනව තුලිතව පවතිනු ඇතැයි තක්සේරු කර ඇත.

ආර්ථික වර්ධන පුරෝකථන මත පවතින අවදානම්

නුදුරු කාලයේ සිට මැදි කාලය දක්වා ආර්ථික වර්ධනය පුරෝකථනය කළ මට්ටමට වඩා පහළ යෑමේ ප්‍රධාන අවදානම් ලෙස, අනෙකුත් සාධක අතර, ආර්ථික වර්ධන අපේක්ෂා මත ඉහළ බලපෑමක් ඇති කරන එක්සත් ජනපද තීරු බදු සම්බන්ධ අවිනිශ්චිතතා ඇතුළත් වේ. ශ්‍රී ලංකාව විසින් එක්සත් ජනපදය වෙත සිදු කෙරෙන අපනයන සඳහා එක්සත් ජනපද තීරු බදු වෙනස්කිරීම් හේතුවෙන් සිදු වන බලපෑම අවිනිශ්චිතව පවතින අතර, එය විදේශීය අංශය, වෙළඳපොළ කාර්යසාධනය, වෙළඳපොළ අපේක්ෂා සහ ආයෝජනවල ක්‍රියාකාරීත්වය සීමා කළ හැකිය. තවද, විදේශ ඉල්ලුම වර්ධනය නොවීම, සාපේක්ෂ වාසිවල වෙනස්කම් හේතුවෙන් ඇතිවන අවිනිශ්චිතතා, විකල්ප වෙළඳ ගමනාන්ත සොයා යන රටවල නව ආනයන සමඟ දේශීය නිෂ්පාදකයන්ට තරග කිරීමට සිදුවීමේ හැකියාව, ආනයනික අමුද්‍රව්‍ය සහ අතරමැදි භාණ්ඩවල ඇතිවිය හැකි මිල ඉහළ යෑම් වැනි නොයෙකුත් අංශ ඔස්සේ ගෝලීය සාර්ව ආර්ථික අවිනිශ්චිතතා විදේශීය අංශයට බලපෑම් ඇති කළ හැකිය. එයට අමතරව, සිදුවිය හැකි භූ දේශපාලනික අර්බුද ඉහළ යෑම් මගින් විදේශ ඉල්ලුම පහළ දැමීම, විදේශ සේවා නියුක්තිය සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවලට බාධා ඇතිවීම සහ සංචාරක කර්මාන්තයට සෘණාත්මක ලෙස බලපෑම සිදු විය හැකිය. කාලගුණය සම්බන්ධ සාධක ද ඉදිරි කාලයේ දී රටේ ආර්ථික ක්‍රියාකාරිත්වයට සැලකිය යුතු බලපෑමක් කළ හැකිය. තවද, කෘෂිකාර්මික නිෂ්පාදනය හා ආහාර සැකසුම් වැනි අංශ දේශගුණික විපර්යාසයන් කෙරෙහි දක්වන වැඩි සංවේදීතාවය හේතුවෙන්, මැදි කාලීනව, එවැනි සිදුවීම් ශ්‍රී ලංකාවේ ආර්ථික ක්‍රියාකාරකම් කෙරෙහි බලපෑම් ඇති කළ හැකිය.

ආර්ථික වර්ධනය, පුරෝකථනවලට වඩා ඉහළ යෑම සඳහා පවතින අවදානම් සැලකූ විට, කෘෂිකාර්මික අංශය අපේක්ෂා කළ මට්ටමට වඩා හොඳින් යථා තත්ත්වයට පත්වීම, නුදුරු කාලයේ ආර්ථික වර්ධනය ඉහළ යෑම සඳහා හේතු විය හැකි ය. තවද, ආර්ථික වර්ධන සහ අපනයන ප්‍රවර්ධන උපායමාර්ග කඩිනමින් ක්‍රියාත්මක කිරීම මැදි කාලීනව ආර්ථික වර්ධන අපේක්ෂා වැඩි දියුණු කළ හැකිය.

2.4. පෙර පුරෝකථන සමඟ සැසඳීම[8]

මැදි කාලීන පුරෝකථන සඳහා භාවිත කළ ප්‍රධාන උපකල්පන

2025 වසරේ ජූලි මස පැවති මුදල් ප්‍රතිපත්ති වාරයේ දී භාවිත කරන ලද ගෝලීය පුරෝකථන, 2025 වසරේ පෙබරවාරි මස මුදල් ප්‍රතිපත්ති වාර්තාව සඳහා භාවිත කරන ලද 2025 වසරේ ජනවාරි මාසයේ පැවති තොරතුරු සමඟ සසඳන විට, ශ්‍රී ලංකාවේ ප්‍රධාන වෙළඳ හවුල්කරුවන්ගේ අපනයන අනුව බර තබන ලද විදේශ නිමැවුම් පරතරය පිළිබඳ ඉදිරි දැක්ම පිරිහීමට ලක් වී ඇත. එක්සත් ජනපදය, යුරෝ කලාපය සහ එක්සත් රාජධානියේ ආර්ථිකයන්ට අදාළ පුරෝකථන සංශෝධනය වීම මෙම වෙනසට මූලික වශයෙන් හේතු වී ඇත. 2025 වසරේ ජූලි මස පැවති මුදල් ප්‍රතිපත්ති වාරයේ දී භාවිත කරන ලද ගෝලීය පුරෝකථන මගින් 2025 වසරේ ජනවාරි මාසයේ මුදල් ප්‍රතිපත්ති වාරයට බොහෝ දුරට සමාන ආහාර උද්ධමනයක් පුරෝකථනය කරයි. එක්සත් ජනපද තීරුබදු සහ භූ දේශපාලනික ගැටුම් සම්බන්ධ අවහිරතා මධ්‍යයේ ගෝලීය ඉල්ලුම මත ඇති වූ බලපෑම හේතුවෙන්, 2025 වසරේ ජනවාරි මාසයේ පුරෝකථනවලට සාපේක්ෂව ගෝලීය බනිජතෙල් මිල ගණන් සැලකිය යුතු ලෙස පහළ ගොස් ඇත. මේ අතර, එක්සත් ජනපද ෆෙඩරල් සංචිත බැංකුවේ සුපරික්ෂාකාරී ප්‍රතිපත්ති ප්‍රවේශය මධ්‍යයේ, එක්සත් ජනපදයේ මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කිරීම පෙර පුරෝකථනයට වඩා මන්දගාමී වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මුදල් අමාත්‍යාංශය විසින් 2025 වසරේ ජූනි මස ප්‍රකාශයට පත් කළ 2026 වසර සඳහා වන රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශනය මත පදනම්ව, වත්මන් පුරෝකථනවල රාජ්‍ය මූල්‍ය අංශයේ ගමන් මගෙහි සංශෝධන සිදුකර ඇත. 2025 වසරේ ජනවාරි මාසයේ මුදල් ප්‍රතිපත්ති වාරය සමඟ සසඳන විට, මෙම යාවත්කාලීන කිරීම මගින් සුළු වශයෙන් ඉහළ අයවැය හිඟයක් පුරෝකථනය කරන අතර ප්‍රාථමික ශේෂය ස්ථායීව පවත්වා ගනු ලබයි. නවතම තොරතුරුවලට අනුව, 2025 වසරේ ජනවාරි මාසයේ මුදල් ප්‍රතිපත්ති වාරයේ අපේක්ෂා කළ සුළු හිඟයට සාපේක්ෂව, 2025 වසර සඳහා විදේශීය ජංගම ගිණුමේ අතිරික්තයක් අපේක්ෂා කෙරේ.

[8] මෙම කොටස මගින් 2025 පෙබරවාරි මස මුදල් ප්‍රතිපත්ති වාර්තාවේ ඉදිරිපත් කරන ලද, 2025 වසරේ ජනවාරි මස මුදල් ප්‍රතිපත්ති වාරයේ දී පැවති පුරෝකථනයට සාපේක්ෂව වත්මන් පුරෝකථන සංසන්දනය කෙරේ.

06 රූප සටහන: ගෝලීය පුරෝකථන (කාර්තුමය)



සටහන: සැලකිල්ලට ගන්නා රටවල් බහුතරයක දත්ත සියල්ලම ලැබෙන තෙක් නවතම GPMN පුරෝකථනවල වඩාත්ම මෑත කාලීන දත්ත වාර්තා වූ කාලපරිච්ඡේදය ලෙස 2025 වසරේ පළමු කාර්තුව සැලකේ.

මූලයන්: කාර්තුමය පුරෝකථන ආකෘතිය, Global Projection Model Network (GPMN) (2025/01/21 සහ 2025/06/25 යාවත්කාලීන කිරීම)

උද්ධමනයේ හැසිරීම

2025 පෙබරවාරි මුදල් ප්‍රතිපත්ති වාර්තාවේ ප්‍රකාශයට පත් කරන ලද පුරෝකථන හා සැසඳීමේ දී 2025 වසරේ පළමුවන කාර්තුවේ වාර්තා වූ වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය සමස්තයක් ලෙස පුරෝකථනය කළ මට්ටම ආසන්නයේ පැවතුණි. කෙසේ වෙතත්, 2025 වසරේ දෙවන කාර්තුවේ දී වාර්තා වූ උද්ධමනය පෙර පුරෝකථනයට වඩා අඩු වීම කෙරෙහි අපේක්ෂා කළ කාලයට වඩා ප්‍රමාද වූ විදුලි ගාස්තු ඉහළ දැමීමේ සංශෝධනය, කිහිපවරක් ඉන්ධන මිල ගණන් අඩු කිරීම මෙන්ම ආහාර මිල ගණන් අඩු වීම ප්‍රධාන වශයෙන්

දායක විය. එසේ වුවත්, 2025 වසරේ ජූනි මස විදුලි ගාස්තු ඉහළ නැංවීම හේතුවෙන් ඉදිරියේ දී බලශක්ති හා ප්‍රවාහන අවධමනය ලිහිල් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතර, ගෝලීය බනිජතෙල් මිල ගණන් පහළ යෑම සහ ආහාර මිල ගණන් අඩු වීම හේතුවෙන් නුදුරු කාලීන පුරෝකථන ද පෙර මුදල් ප්‍රතිපත්ති වාර්තාවේ සඳහන් පුරෝකථනවලට වඩා පහතින් පැවතුණි. පෙර පුරෝකථනවලට සමානව, ආර්ථිකයේ වැඩි දියුණු වූ ඉල්ලුම් තත්ත්ව සමඟ උද්ධමනය මැදි කාලීනව, උද්ධමන ඉලක්කය වටා ක්‍රමයෙන් ස්ථායී වනු ඇතැයි අපේක්ෂා කෙරේ. වඩාත් හිතකර දත්ත මගින් පෙන්නුම් කරනු ලබන ඉහළ වර්ධන පුරෝකථන හේතුවෙන්, මූලික උද්ධමනයේ මැදි කාලීන පුරෝකථන, පෙර මුදල් ප්‍රතිපත්ති වාර්තාව හා සැසඳීමේ දී ඉහළ මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

3. වර්තමාන ආර්ථික තත්ත්වය

3.1. උද්ධමනය

2025 වසරේ මාර්තු මාසයේ සිට අවධමන තත්ත්වයේ ලිහිල් වීම ආරම්භ වූ අතර, ආහාර උද්ධමනය ඉහළ යෑම සහ පාලිත මිල ගණන් ඉහළ දැමීම ඊට හේතු විය.

07 රූප සටහන: මතුපිට සහ මූලික උද්ධමනයේ හැසිරීම (කො.පා.මි.ද., 2021=100)



මූලය: ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද., 2021=100) පදනම් කරගත් වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය, 2024 වසරේ දෙසැම්බර් මාසයේ දී වාර්තා වූ -1.7%ක අගයේ සිට 2025 වසරේ ජනවාරි මාසයේ දී -4.0%ක් දක්වා කැපී පෙනෙන අයුරින් පහළ ගියේය. මතුපිට උද්ධමනයේ මෙම පහත වැටීම සඳහා ප්‍රධාන වශයෙන් 2024 වසරේ ජනවාරි මාසයේ දී ක්‍රියාවට නැංවූ එකතු කළ අගය මත බදු සංශෝධන මගින් හටගත් සංඛ්‍යානම පදනම් බලපෑම හේතු විය. 2025 වසරේ පෙබරවාරි මාසයේ දී ඉහළම අවධමන මට්ටම වාර්තා වූ අතර, එය 4.2%ක් ලෙස සටහන් විය. ඊට ප්‍රධාන වශයෙන් හේතු වූයේ 2025 වසරේ ජනවාරි මස මැද භාගයේ දී විදුලි ගාස්තු අඩු කරමින් සිදු කළ සංශෝධනයයි. කෙසේ වුවද, ආහාර උද්ධමනය ඉහළ යෑම හේතුවෙන් 2025 වසරේ මාර්තු මාසයේ සිට ඉදිරියට අවධමන තත්ත්වයේ ලිහිල් වීම ආරම්භ විය. 2025 වසරේ ජූනි මස මැද භාගයේ දී විදුලි ගාස්තු ඉහළ දැමීම සහ සංඛ්‍යානමය පදනම් බලපෑමේ ධනාත්මක දායකත්වය අවධමනයේ ලිහිල් වීම සඳහා සහාය විය. මෙම ප්‍රවණතා මධ්‍යයේ වුවද, 2025 වසරේ ජූනි මාසයේ දී ද මතුපිට උද්ධමනය -0.6%ක් (වාර්ෂික ලක්ෂ්‍යමය) වාර්තා කරමින් අඛණ්ඩව ඍණාත්මක මට්ටමක පැවතුණි.[9] 2025 වසරේ ජූනි මාසයේ දී, කො.පා.මි.ද. පදනම් කර ගත් වාර්ෂික ලක්ෂ්‍යමය ආහාර උද්ධමනය 4.3%ක ධන අගයක පැවති අතර, ආහාර නොවන උද්ධමනය -2.8%ක අගයක් වාර්තා කරමින් ඍණ කලාපයේ තවදුරටත් පැවතුණි. මේ අතර, ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද., 2021=100) පදනම් කර ගත් වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය 2025 වසරේ පළමු භාගයේ දී සමස්තයක් ලෙස ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය. අඛණ්ඩව මාස 8ක දී අවධමන තත්ත්වයක් වාර්තා වීමෙන් අනතුරුව, ජා.පා.මි.ද. පදනම් කර ගත් මතුපිට උද්ධමනය ආහාර මිල ඉහළ

[9] 2025 වසරේ ජූලි මාසයේ දී, කො.පා.මි.ද. පදනම් කරගත් වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය -0.3%ක් ලෙස වාර්තා විය.

යැම හේතුවෙන් 2025 වසරේ මැයි මාසයේ දී ධන අගයකට පත් වූ අතර, 2025 වසරේ ජූනි මාසයේ දී 0.3%ක් ලෙස වාර්තා විය.

08 රූප සටහන: වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය සඳහා දායකත්වය (කො.පා.මි.ද.)



මූලයන්: ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකු කාර්යමණ්ඩල ගණනය කිරීම්

09 රූප සටහන: වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය සඳහා උපකාණ්ඩ අනුව දායකත්වය (කො.පා.මි.ද.)



සටහන: කො.පා.මි. දර්ශකයේ උපකාණ්ඩවල බර තැබීම් වරහන් තුළ දක්වා ඇත.

මූලයන්: ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකු කාර්යමණ්ඩල ගණනය කිරීම්

කො.පා.මි.ද. පදනම් කරගත් මාසික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය, 2025 වසරේ ජනවාරි මාසයේ දී යම් ධන තත්ත්වයකට පත් වීමෙන් පසුව 2025 වසරේ පෙබරවාරි මාසයේ දී ඍණ අගයකට පත්විය. ඊට මූලික වශයෙන් හේතු වූයේ 2025 වසරේ ජනවාරි මාසයේ දී විදුලි ගාස්තු පහළ දමමින් සිදුකළ මිල සංශෝධනයි. 2025 වසරේ

මාර්තු මාසයේ සිට අප්‍රේල් මාසය දක්වා ද මාසික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය සෘණ අගයක පැවති අතර, මහ කන්නයේ අස්වැන්න ලැබීමත් සමඟ ආහාර මිල පහළ යෑම ඊට ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ වුවද, ආහාර මිල ඉහළ යෑම සහ 2025 වසරේ ජූනි මස මැද භාගයේ දී විදුලි ගාස්තු ඉහළ දමමින් සිදුකළ සංශෝධන හේතුවෙන් 2025 වසරේ මැයි මාසයේ සිට මාසික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය ධන අගයකට පත්විය.

10 රූප සටහන: මාසික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය සඳහා දායකත්වය (කො.පා.මි.ද.)



මූලයන්: ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකු කාර්යමණ්ඩල ගණනය කිරීම්

ආර්ථිකයේ යටිදැරි උද්ධමන ප්‍රවණතා පිළිබිඹු කරන කො.පා.මි.ද. පදනම් කරගත් වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනය, 2025 වසරේ මාර්තු මාසය දක්වා අඛණ්ඩව ලිහිල් විය. ඉන් පසුව, එය ක්‍රමයෙන් ඉහළ යෑම ආරම්භ වෙමින් 2025 වසරේ ජූනි මාසයේ දී 1.5%ක අගයක් වාර්තා කළේය.[10] තවද, 2025 වසරේ මාර්තු මාසයේ දී නිරීක්ෂණය කළ මතුපිට උද්ධමනය කැපී පෙනෙන අයුරින් ඉහළ යෑම මූලික උද්ධමනය තුළින් පිළිබිඹු නොවීය. නිතර මිල උච්චාවචනය වන ආහාර සහ බලශක්ති ආශ්‍රිත මිල ගණන් ඉහළ යෑම මූලික උද්ධමනය ගණනයේ දී බැහැර කිරීම ඊට හේතු විය. මේ අතර, 2025 වසරේ ජනවාරි මාසයේ සිට අප්‍රේල් මාසය දක්වා කාලයේ දී කෙටි කාලීනව සෘණ මට්ටමකට පත් වීමෙන් අනතුරුව ජා.පා.මි.ද. පදනම් කරගත් වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනය යළි ධන අගයකට පත් වී 2025 වසරේ ජූනි මාසයේ දී 0.6%ක අගයක් වාර්තා කළේය.

[10] 2025 වසරේ ජූලි මාසයේ දී, කො.පා.මි.ද. පදනම් කරගත් වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනය 1.6%ක් ලෙස වාර්තා විය.

11 රූප සටහන: මතුපිට උද්ධමනය (කො.පා.මි.ද., වාර්ෂික ලක්ෂ්‍යමය,%) විවිධ වර්ණ රූප සටහන



සටහන: 2023 ජනවාරි මාසයට පෙර දත්ත කො.පා.මි.ද.(2013=100) මත පදනම් වන අතර, 2023 ජනවාරි මාසයේ සිට ආරම්භ වන දත්ත කො.පා.මි.ද.(2021=100) මත පදනම් වේ. කො.පා.මි.ද.(2021=100) මත පදනම්ව, වරහන් තුළ මූලික බර තැබීම් සඳහන් කර ඇත. උස මගින් සාපේක්ෂව කාණ්ඩයක මූලික බර තැබීම නිරූපණය වේ (සියලු අයිතමයන් අවස්ථාව හැර)

මූලයන්: ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
මහ බැංකු කාර්යමණ්ඩල ගණනය කිරීම්

2024 වසරේ සිව්වන කාර්තුවේ දී සහ 2025 වසරේ පළමු කාර්තුවේ දී යන අනුක්‍රමික කාර්තු දෙකක දී කොළඹ පාරිභෝගික මිල දර්ශකය පදනම් කරගත් කාර්තුමය මතුපිට උද්ධමනය, මුදල් ප්‍රතිපත්ති රාමුව පිළිබඳ ගිවිසුම මගින් දක්වා ඇති 5%ක ඉලක්කයෙන් ප්‍රතිශතාංක ±2ක ආන්තිකයට වඩා වැඩි අගයකින් අපගමනය වීම හේතුවෙන්, මහ බැංකු පනතේ 26(5) වගන්තිය යටතේ ඒ පිළිබඳ වාර්තාව ගරු මුදල් අමාත්‍යවරයා හරහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදි.[11] මෙය මහ බැංකුව විසින් එලෙස ඉදිරිපත් කරන තෙවන වාර්තාව වන අතර, ඒ පිළිබඳව රාජ්‍ය මූල්‍ය කමිටුවේ දී සාකච්ඡා කිරීමෙන් අනතුරුව මහජනතාවට ද ලබාගත හැකි අයුරින් නිකුත් කරන ලදි. තවද, 2025 වසරේ දෙවැනි කාර්තුවේ දී ද කාර්තුමය මතුපිට උද්ධමනය, උද්ධමන ඉලක්කයෙන් ප්‍රතිශතාංක 2කට වැඩි අගයකින් පහළ මට්ටමක පැවතීම හේතුවෙන් මහ බැංකු පනතේ 26(5) වගන්තිය යටතේ තවත් පසු විපරම් වාර්තාවක් අදාළ කාලයේ දී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කෙරෙණු ඇත. පෙර අවස්ථා කිහිපයක දී මෙන්ම, 2025 වසරේ පළමු සහ දෙවන කාර්තුවල දී මතුපිට උද්ධමනය, උද්ධමන ඉලක්කයෙන් අපගමනය වීමට ද විශේෂයෙන් බලශක්ති මිල ගණන් පහළ දැමීම ඇතුළු සැපයුම් අංශයේ සාධක හේතු විය.

[11] 2024 වසරේ සිව්වන වන 2025 වසරේ පළමු කාර්තුවල දී උද්ධමනය ඉලක්කයෙන් අපගමනය වීම පිළිබඳ වාර්තාව මහ බැංකු වෙබ් අඩවිය හරහා ලබාගත හැකිය.

විශේෂ සටහන (ආ): සේවා උද්ධමනය පිළිබඳ දැනුම්වත් වීම: එය වැදගත් වන්නේ ඇයි?

සේවා උද්ධමනය නිරීක්ෂණය කිරීමේ වැදගත්කම

සේවා උද්ධමනය යනු සේවා සඳහා වන මිල ගණන් ඉහළ යෑමේ වේගයයි. සැපයුම් හා සම්බන්ධ සාධක හෝ ගෝලීය වෙළඳ භාණ්ඩ මිල ගණන් උච්චාවචනය වැනි බාහිර කම්පන සඳහා ක්ෂණිකව ප්‍රතිචාර දක්වන භාණ්ඩ මිල ගණන් මෙන් නොව, සේවා මිල ගණන් සාමාන්‍යයෙන් වඩාත් ක්‍රමානුකූලව සහ මන්දගාමීව වෙනස්වීමේ ප්‍රවණතාවක් පවතී. මෙය ප්‍රධාන වශයෙන්ම, මන්දගාමීව වෙනස් වන සහ කෙටි කාලීන කම්පන සඳහා අඩු වශයෙන් ප්‍රතිචාර දක්වන වැටුප්, කුලී, සෞඛ්‍ය සේවා, සහ අධ්‍යාපන වැනි දේශීය සාධක සමඟ සේවා සඳහා වන මිල ගණන් සම්බන්ධව පැවතීම හේතුවෙන් සිදුවේ (Amatyakul et al. (2024), Bils & Klenow (2004) and Jangam et al. (2024)). තවද, සාමාන්‍යයෙන් සේවාවල අවම ආදේශන හැකියාව සහ ගිවිසුම් ගතවීමේ පවතින සීමා හේතුවෙන් සේවා උද්ධමනයේ අඩු උච්චාවචනය සහ මන්දගාමීව වෙනස්වීම සිදුවේ. එසේම, ගෝලීය වෙළඳ භාණ්ඩ මිල ගණන් හේතුවෙන් සේවා උද්ධමනයට වන බලපෑම අවම බැවින්, සේවා උද්ධමනය දේශීය උද්ධමන පීඩන සහ ඉල්ලුම් තත්ත්ව පිළිබිඹු කරන දර්ශකයක් ලෙස කටයුතු කරයි. මේ හේතුවෙන්, දියුණු ආර්ථිකයන් මෙන්ම නැගී එන ආර්ථිකයන්හි මහ බැංකු යටිදැරි සහ දිගු කාලයක් පවත්නා උද්ධමන ප්‍රවණතා මනාව සලකා බැලීම සඳහා සේවා උද්ධමනය නිරීක්ෂණය සහ විශ්ලේෂණය කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කරයි.

ශ්‍රී ලංකාවේ සේවා උද්ධමනයේ ප්‍රවණතා

ශ්‍රී ලංකාව තුළ, සේවා සම්බන්ධ සංරචක පාරිභෝගික පැසෙහි අඩකට ආසන්න ප්‍රමාණයක් නියෝජනය කරන අතර සේවා මිල ගණන් සමස්ත (මතුපිට) උද්ධමනයට සහ ජීවන වියදමට සැලකිය යුතු බලපෑමක් සිදු කරයි.[1] එබැවින්, උද්ධමන වෙනස්කම් වඩාත් හොඳින් ග්‍රහණය කරගැනීම, පුරෝකථන ආකෘතිවල නිරවද්‍යතාව වැඩි දියුණු කිරීම, සහ වඩාත් ඵලදායී සහ කාලෝචිත ප්‍රතිපත්ති මැදහත්වීම් සඳහා ඉඩ ප්‍රස්තාව ලබා දීම සඳහා සේවා අංශයේ මිල ගණන් නිරීක්ෂණය කිරීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම ඉතා වැදගත් වේ.[2]

කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද., 2013=100 and 2021=100) ඇසුරින් ලබාගත්, 2015 - 2025 (ජූලි දක්වා) කාලය තුළ ශ්‍රී ලංකාවේ වාර්ෂික ලක්ෂ්‍යමය සේවා උද්ධමනය ආ.1 රූප සටහන මගින් නිරූපණය කෙරේ. මතුපිට උද්ධමනයට සහ සේවා නොවන උද්ධමනය හා සැසඳීමේ දී, සේවා උද්ධමනය සාපේක්ෂව ස්ථාවර ව පවතින බව රූප සටහන මගින් සහ ඒ සමඟ ඇති සංඛ්‍යාන මිනුම් මගින් පෙන්නුම් කරයි. තවද, මෑත කාලීන ප්‍රවණතා සලකා බැලීමේ දී, 2024 වසර සහ 2025 වසරේ මේ දක්වා සේවා උද්ධමනය, සේවා නොවන උද්ධමනයට සාපේක්ෂව ඉහළ මට්ටමක පවතින අතර, එමගින් මෙම කාලය තුළ මතුපිට උද්ධමනය පහළ මට්ටමක පැවතීමට තුඩු දුන් සැපයුම් හා සම්බන්ධ සාධකවල බලපෑම පෙන්නුම් කරයි.

ආ.1 රූප සටහන: කො.පා.මි.ද. (2013=100 සහ 2021=100) මත පදනම් වූ සේවා උද්ධමනයේ හැසිරීම (වාර්ෂික ලක්ෂ්‍යමය)



	සේවා	මතුපිට	සේවා නොවන
උද්ධමනයේ සාමාන්‍යය (AVG,%)	6.6	9.3	11.8
විචලතාව (සම්මත අපගමනය (STD), %)	7.9	15.8	23.0
විචලන සංගුණකය ((STD/AVG), Ratio)	1.2	1.7	1.9

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, මහ බැංකු කාර්යමණ්ඩල ගණනය කිරීම්

[1] 2018 වසරේ අරමුණ අනුව ඒකපුද්ගල පරිභෝජනය වර්ගීකරණය (Classification of Individual Consumption According to Purpose 2018) භාවිත කරමින් සමස්ත (මතුපිට) පාරිභෝගික මිල දර්ශකයේ භාණ්ඩ හා සේවා පැසවලින් (2013=100 සහ 2021=100) සේවා සම්බන්ධ සංරචක උකහා ගෙන ඇත.

[2] සේවා උද්ධමනයේ වැදගත්කම සැලකීමේ දී, සේවාවල මිල ගණන් නිතිපතා සහ ක්‍රමානුකූලව නිරීක්ෂණය කිරීමට ක්‍රමවත් වැඩ පිළිවෙළක් අත්‍යවශ්‍ය වේ.

මතුපිට උද්ධමනයට සේවා උද්ධමනය, ආහාර උද්ධමනය සහ බලශක්ති හා ඉන්ධන උද්ධමනයේ දායකත්වය ආ.2 රූප සටහන මගින් නිරූපණය කරයි. මතුපිට උද්ධමනයට සේවා උද්ධමනයේ දායකත්වය සැලකිය යුතු විශාල අගයක් ගනී. මෑත මාසවල දී, සේවා උද්ධමනය, සමස්ත උද්ධමනය ඉහළ යෑම සඳහා බලපා ඇති අතර, මෑත කාලීන අවධමන ප්‍රවණතාව පිළිබිඹු කරමින් බලශක්ති හා ඉන්ධන උද්ධමනය, සමස්ත උද්ධමනය පහළ යෑම සඳහා බලපා ඇත.

ආ.2 රූප සටහන: මතුපිට උද්ධමනයට දායකත්වය (කො.පා.මි.ද., 2013=100 සහ 2021=100)



මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, මහ බැංකු කාර්යමණ්ඩල ගණනය කිරීම්

විශේෂයෙන්ම, මතුපිට උද්ධමනය පාලනය කිරීම සහ මිල ස්ථායීතාව පවත්වාගෙන යෑමේ සුවිශේෂී කාර්යභාරය සැලකිල්ලට ගැනීමේ දී, සේවා උද්ධමනයට ආවේනික ලක්ෂණ මගින්, සේවා උද්ධමන ගතිකයන් වඩාත් පැහැදිලිව සමස්ත උද්ධමනය නිරීක්ෂණයට සහ ප්‍රතිපත්ති සම්පාදන රාමුවට ඇතුළත් කිරීමේ වැදගත්කම අවධාරණය කරයි.

මූලාශ්‍ර:

1. Amatyakul, P., Igan, D., & Lombardi, M. J. (2024, March 4). Sectoral price dynamics in the last mile of post-Covid-19 disinflation. *BIS Quarterly Review.* Bank for International Settlements.
2. Bils, M., & Klenow, P. J. (2004). Some evidence on the importance of sticky prices. *Journal of Political Economy, 112(5),* 947–985.
3. Jangam, P., Rath, B. N., & Perera, S. (2024, September 6). *Analyzing price rigidity and price convergence in the services sector of Sri Lanka* [Paper presentation]. 5th CBSL-ADBI-APAEA Joint Workshop, Central Bank of Sri Lanka. URL
4. United Nations Statistics Division. (2018). *Classification of Individual Consumption According to Purpose (COICOP) 2018.* United Nations.

පවතින තොරතුරුවලට අනුව,[12] 2025 වසර තුළ දී, අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකය (2018=100) සහ රාජ්‍ය අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකය (2016=100) යන ද්විත්වයම ඉහළ යෑමක් වාර්තා කළේය.

2024 වසරේ දී නිරීක්ෂණය කරන ලද නාමික වැටුප්වල ඉහළ යාමේ ප්‍රවණතාව අඛණ්ඩව පවත්වා ගනිමින්, නාමික අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකය 2025 වසරේ ජනවාරි සිට මැයි දක්වා කාලයේ දී වැඩිවීමක් වාර්තා කළේය. වැටුප් වර්ධනය කෘෂිකාර්මික, කාර්මික සහ සේවා අංශවල ක්‍රියාකාරකම් පුරා දක්නට ලැබිණි. කෘෂිකාර්මික ක්‍රියාකාරකම් ඉහළම වැටුප් වර්ධනයක් වාර්තා කළ අතර, ඇතැම් කෘෂිකාර්මික

[12] මෙම කොටසේ දත්ත, මහ බැංකුව විසින් සම්පාදනය කරන ලද රාජ්‍ය අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකය (2016=100) සහ අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකය (2018=100) මත පදනම් වේ.

ක්‍රියාකාරකම්වල පැවති සේවක හිඟය හේතුවෙන් වැටුප් පීඩනය ඉහළ යෑම ඊට මූලික වශයෙන් හේතු විය. මේ අතර, අවධමන තත්ත්වය ලිහිල් වීමත් සමඟ අනුරූප කාලයේ දී අවිධිමත් පෞද්ගලික අංශයේ මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශකයේ වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත වර්ධනය මන්දගාමී විය.

රාජ්‍ය අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකය (2016=100) මගින් මනිනු ලබන රාජ්‍ය අංශයේ සේවකයින්ගේ නාමික වැටුප්, 2025 වසරේ මේ දක්වා කාලයේ දී 13.7%ක ඉහළ යෑමක් වාර්තා කළේය. 2024 වසරේ දී ක්‍රියාත්මක කරන ලද ජීවන වියදම් දීමනා හිඟ මුදල්, 2025 වසරේ ජනවාරි මාසයේ සිට සමාන වාරික තුනක් වශයෙන් ගෙවීම් ආරම්භ කිරීම ඊට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත. ඊට අමතරව, 2025 වසරේ අයවැය මගින් ප්‍රකාශයට පත්කළ පරිදි, අවම මූලික වැටුප ඉහළ දැමීමෙන් සහ විවිධ දීමනා හඳුන්වා දීමෙන් රාජ්‍ය අංශයේ වැටුප් ව්‍යුහය සංශෝධනය කරන ලදි. කෙසේ වුවද, නාමික සහ මූර්ත යන ද්විත්වයේම වැටුප් වර්ධනය මෙම කාල සීමාවේ දී මන්දගාමී වූ අතර, පසුව අවධමන තත්ත්වය ලිහිල් වීමේ ප්‍රතිඵලයක් ලෙස මූර්ත වැටුප් වර්ධනය කැපී පෙනෙන අයුරින් පහළ ගියේය.

12 රූප සටහන: අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකයේ (2018=100) සහ රාජ්‍ය අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකයේ (2016=100) වෙනස්වීම්



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

3.2. මූර්ත අංශය

2025 වසරේ පළමු කාර්තුව තුළ ශ්‍රී ලංකා ආර්ථිකය ස්ථාවර වර්ධන මාවතක් පිළිබිඹු කරමින්, එහි ධනාත්මක ප්‍රවණතාව අඛණ්ඩව පවත්වා ගෙන ගියේය.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ද.දේ.නි. ඇස්තමේන්තුවලට අනුව, කර්මාන්ත හා සේවා ක්‍රියාකාරකම්වල ධනාත්මක ක්‍රියාකාරිත්වය හේතුවෙන්, ශ්‍රී ලංකා ආර්ථිකය 2025 වසරේ පළමු කාර්තුවේ දී 4.8%කින් (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත) වර්ධනය වූ අතර, කෘෂිකාර්මික කටයුතු සුළු පහළ යෑමක් වාර්තා කළේය.

කර්මාන්ත අංශයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් නිෂ්පාදන හා ඉදිකිරීම් ක්‍රියාකාරකම් හේතු වූ අතර, සේවා අංශයේ වර්ධනය සඳහා මූල්‍ය සේවා සහ නවාතැන් සැපයීම් සේවා ප්‍රධාන වශයෙන් දායක විය. මේ අතර, කෘෂිකාර්මික කටයුතුවල පහළ යෑම සඳහා පොල් නිෂ්පාදනය සහ මිරිදිය ධීවර කටයුතුවල සංකෝචනය බොහෝ දුරට හේතු විය.

01 සංඛ්‍යා සටහන: මූර්ත ද.දේ.නි. වර්ධන ඇස්තමේන්තු (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, %) (තාවකාලික)

ආර්ථික කටයුතු	2024					2025
	පළමු කාර්තුව	දෙවන කාර්තුව	තුන්වන කාර්තුව	සිව්වන කාර්තුව	වාර්ෂික	පළමු කාර්තුව
කෘෂිකර්මාන්තය	0.9	2.7	3.7	-2.2	1.2	-0.7
කර්මාන්ත	11.2	9.7	10.1	13.1	11.0	9.7
සේවා	2.5	1.9	2.6	2.5	2.4	2.8
ද.දේ.නි.	**5.1**	**4.1**	**5.3**	**5.4**	**5.0**	**4.8**

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ප්‍රධාන ආර්ථික අංශ තුනෙහිම ක්‍රියාකාරකම්වල ධනාත්මක දායකත්වයෙන්, 2025 වසරේ දෙවන කාර්තුවේ දී ආර්ථිකයේ වර්ධනය අඛණ්ඩව පවතිනු ඇතැයි දැනට පවතින ඉදිරි ආර්ථික දර්ශක මගින් පෙන්නුම් කෙරේ. 2025 වසරේ අප්‍රේල්-මැයි කාලපරිච්ඡේදය තුළ දී කාර්මික නිෂ්පාදන දර්ශකය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත වර්ධනයක් වාර්තා කිරීමත්, නිෂ්පාදන සහ ඉදිකිරීම් සඳහා වන ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අප්‍රේල් මාසයේ දී සාමාන්‍යයෙන් වාර්තා කරන පහත වැටීමෙන් අනතුරුව නැවත ඉහළ යෑමත් මගින් කර්මාන්ත ආශ්‍රිත දර්ශක අඛණ්ඩ වර්ධනයක් පෙන්නුම් කළේය.[13] සේවා අංශයේ ක්‍රියාකාරකම් සලකා බලන විට, එම අංශයේ සමස්ත දියුණුවක් පෙන්නුම් කරමින් සේවා අංශයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2025 වසරේ දෙවන කාර්තුව තුළ දී කැපී පෙනෙන වර්ධනයක් වාර්තා කළේය. මේ අතර, 2025 වසරේ අප්‍රේල් - මැයි කාලපරිච්ඡේදය තුළ දී තේ නිෂ්පාදනයේ දක්නට ලැබුණු සැලකිය යුතු වර්ධනය සහ 2025 යල කන්නයේ දී අපේක්ෂිත යහපත් වී අස්වැන්න මගින් පිළිබිඹු වන පරිදි 2025 වසරේ දෙවන කාර්තුවේ දී කෘෂිකාර්මික කටයුතුවල යථා තත්ත්වයට පත්වීමක් අපේක්ෂා කෙරේ.

13 රූප සටහන: ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සහ කාර්මික නිෂ්පාදන දර්ශකයේ වෙනස් වීම



මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

[13] නවතම දත්ත නිකුතුවට අනුව, ඉදිකිරීම් සඳහා වන ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2025 ජූනි මාසයේ දී 58.6ක් වූ අතර, එය ඉදිකිරීම් කටයුතුවල අඛණ්ඩ ප්‍රසාරණයක් පෙන්නුම් කරයි. මේ අතර, 2025 මැයි මාසයේ දී 98.2ක් වූ කාර්මික නිෂ්පාදන දර්ශකය 2025 ජූනි මාසයේ දී 98.5ක් දක්වා ඉහළ ගියේය.

වියදම් ප්‍රවේශය සැලකීමේ දී, පරිභෝජන සහ ආයෝජන වියදම් යන සංරචක දෙකම 2025 වසරේ පළමු කාර්තුවේ දී ස්ථාවර මිල ගණන් යටතේ දේශීය ඉල්ලුමට ධනාත්මක ලෙස දායක වූ අතර, භාණ්ඩ හා සේවා අපනයන වර්ධන වේගයට සාපේක්ෂව භාණ්ඩ හා සේවා ආනයනවල වර්ධන වේගය ඉහළ යෑම හේතුවෙන් ශුද්ධ විදේශීය ඉල්ලුමෙහි සංකෝචනයක් වාර්තා විය. 2025 වසරේ දෙවන කාර්තුවේ දී, ස්ථාවර මිල ගණන් යටතේ පරිභෝජන සහ ආයෝජන වියදම් ආර්ථිකයට ධනාත්මක ලෙස දායක වනු ඇතැයි අපේක්ෂා කරන අතර, ශුද්ධ විදේශීය ඉල්ලුම සංකෝචනය වී පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

02 සංඛ්‍යා සටහන: සමස්ත ඉල්ලුම (තාවකාලික)

අයිතමය	ස්ථාවර මිල අනුව (2015)					
	2024		2024 පළමු කාර්තුව		2025 පළමු කාර්තුව	
	රුපියල් බිලියන	වාර්ෂික ලක්ෂ්‍යමය %	රුපියල් බිලියන	වාර්ෂික ලක්ෂ්‍යමය %	රුපියල් බිලියන	වාර්ෂික ලක්ෂ්‍යමය %
දේශීය ඉල්ලුම	12,617	7.1	3,294	5.0	3,504	6.4
පරිභෝජනය	9,478	3.2	2,159	-7.8	2,302	6.6
ආයෝජනය (දළ ප්‍රාග්ධන සම්පාදනය)	3,139	21.1	1,135	42.8	1,202	5.9
ශුද්ධ විදේශීය ඉල්ලුම	-144	-243.2	25	13.8	-27	-208.2
+ භාණ්ඩ හා සේවා අපනයන	3,020	12.5	779	19.3	828	6.3
- භාණ්ඩ හා සේවා ආනයන	3,164	22.5	754	19.5	854	13.3
ද.දේ.නි.	**12,472**	**5.0**	**3,319**	**5.1**	**3,477**	**4.8**

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

3.3. මුදල් අංශය

පොලී අනුපාතික

2025 වසරේ ජූනි මාසයේ මැද සිට රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතිකවල සුළු වශයෙන් ඉහළ යෑමක් දක්නට ලැබුණද, ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට ප්‍රතිචාරීව වෙළඳපොළ පොලී අනුපාතික පුළුල් වශයෙන් පහළ ගියේය.

2025 මැයි මාසයේ සිදු කරන ලද එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතික අඩු කිරීමට අනුකූලව, කෙටි කාලීන වෙළඳපොළ පොලී අනුපාතික අඩු වූ අතර, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය (AWCMR) එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය (OPR) වටා අඛණ්ඩව රැඳී පැවතුණි. බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය (AWPR), මුදල් වෙළඳපොළ පොලී අනුපාතික අඩු වීමත් සමඟ අඛණ්ඩව පහළ ගිය අතර, 2025 ජූනි මාසය අවසානය වන විට 8.22%ක් වාර්තා කරමින් 2025 වසර තුළදී පදනම් අංක 70කින් අඩු විය. ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සම්ප්‍රේෂණය වීම පිළිබිඹු කරමින් අනෙකුත් වෙළඳපොළ ණය සහ තැන්පතු පොලී අනුපාතික ද මෙම කාලසීමාව තුළ දී අඛණ්ඩව පහළ ගියේය. මේ අතර, බරිත සාමාන්‍ය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර නව ණය පොලී අනුපාතිකය මගින් පෙන්නුම් කරන, බැංකු විසින් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර (MSME) අංශයට ලබා දෙන නව ණය සඳහා වන අනුපාතිකය ද, 2025 ජනවාරි-මැයි කාලපරිච්ඡේදය තුළ සැලකිය යුතු පහළ යෑමක් වාර්තා කර ඇත.

14 රූප සටහන: එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකයේ සහ බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකයේ හැසිරීම



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

වෙළඳපොළ පොලී අනුපාතික සමස්තයක් ලෙස අඩු වුවද, අර්බුදයට පෙර පැවති දිගු කාලීන සාමාන්‍යයට සාපේක්ෂව වෙළඳපොළ ණය පොලී අනුපාතික සහ තැන්පතු පොලී අනුපාතික අතර පරතරය තවදුරටත් අඛණ්ඩව ඉහළ මට්ටමක පවතින අතර, ඒ සඳහා ණය පොලී අනුපාතික අඩු වීමට සාපේක්ෂව තැන්පතු පොලී අනුපාතිකවල සැලකිය යුතු අඩුවීම මෙන්ම තෝරාගත් ණය උපකරණ සඳහා සාපේක්ෂව ඉහළ පොලී අනුපාතික අය කිරීම යන කරුණු කිසියම් දුරකට හේතු වී ඇත. වෙළඳපොළ ණය පොලී අනුපාතිකවල අපේක්ෂිත අඩු වීම සමඟ මෙම පරතරය ඉදිරි කාලයේ දී සාමාන්‍යකරණය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

15 රූප සටහන: තෝරාගත් වෙළඳපොළ පොලී අනුපාතිකවල වෙනස්වීම්



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

2025 වසරේ මැයි මාසයේ දී ප්‍රතිපත්ති පොලී අනුපාතිකය අඩු කිරීමෙහි සහ පැවති අඩු උද්ධමන පරිසරයෙහි සහාය ලබමින්, 2025 වසරේ ජනවාරි-ජූලි කාලපරිච්ඡේදය තුළ ප්‍රාථමික වෙන්දේසිවල සියලුම කල්පිරීම්වලට අදාළ භාණ්ඩාගාර බිල්පත් මත ඵලදා අනුපාතික පදනම් අංක 90-100 කින් පහත වැටුණි. මේ අතර, ප්‍රාථමික සහ ද්විතීයික වෙළඳපොළ දෙකෙහිම දිගුකාලීන රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික පහත වැටුණු අතර, එහි ප්‍රතිඵලයක් ලෙස 2025 වසරේ ජූනි අවසානය වන විට ඵලදා වක්‍රය සාමාන්‍ය තත්ත්වයට පත්ව තිබිණි. කෙසේ වෙතත්, 2025 වසරේ ජූනි මැද භාගයේ සිට ඵලදා අනුපාතිකයන්හි සුළු වැඩිවීමක් දක්නට ලැබුණි.

මේ අතර, 2025 වසරේ පළමු භාගය මුළුල්ලේම මූර්ත පොලී අනුපාතික ඉහළ මට්ටමක පැවතුණි. කෙසේ වෙතත්, අවධමනය ලිහිල්වීම සහ වෙළඳපොළ පොලී අනුපාතික පහළ යෑමේ ඒකාබද්ධ බලපෑම හේතුවෙන් මූර්ත පොලී අනුපාතිකවල පහත වැටීමක් මෑතක දී දක්නට ලැබුණි. ඉදිරි කාලයේ දී උද්ධමනය අපේක්ෂිත පරිදි ඉලක්කගත මට්ටමට ක්‍රමයෙන් ළඟා වීමත් සමඟ මූර්ත පොලී අනුපාතික තවදුරටත් ලිහිල් වීමට ඉඩ ඇත.

16 රූප සටහන: මූර්ත පොලී අනුපාතික



සටහන: නාමික පොලී අනුපාතිකය සඳහා වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය (කො.පා.මි.ද. මත පදනම් වූ) ගැළපීමෙන් මාසික මූර්ත පොලී අනුපාතිකය ගණනය කර ඇත.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාවය

දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාවය, 2025 වසරේ මේ දක්වා කාලය තුළ අඛණ්ඩව අතිරික්ත මට්ටමක පැවතුණි.

දේශීය මුදල් වෙළඳපොළ තුළ අඛණ්ඩව පැවති අතිරික්ත ද්‍රවශීලතා තත්ත්වය හේතුවෙන් 2025 වසරේ ජනවාරි මස අග සිට මහ බැංකුවට එහි වෙළඳපොළට ද්‍රවශීලතාව සපයන විවට වෙළඳපොළ කටයුතු (OMOs) සම්පූර්ණයෙන්ම නවතා දැමීමට හැකි වූ අතර, ද්‍රවශීලතා හිඟයන්ට මුහුණ දුන් වෙළඳපොළ සහභාගීවන්නන් හට තම අරමුදල් අවශ්‍යතා වෙළඳපොළ තුළින් සපුරා ගැනීමට හැකි විය. මහ බැංකුව විසින් සිදු කරන ලද ශුද්ධ විදේශ විනිමය මිලදී ගැනීම් මෙන්ම මෙම කාලය තුළ සිදු කරන ලද විදේශ විනිමය හුවමාරු පහසුකම් ඔස්සේ රුපියල් ද්‍රවශීලතාව වෙළඳපොළට සැපයීම, මෙම අතිරික්ත ද්‍රවශීලතාවයට ප්‍රධාන වශයෙන් හේතු විය. මේ අතර, විදේශ ණය සේවාකරණ ගෙවීම් සඳහා රජය මහ බැංකුවෙන් විදේශ විනිමය මිලදී ගැනීම, වාණිජ බැංකු විසින්

ව්‍යවහාර මුදල් ආපසු ගැනීම, මහ බැංකුව සතු භාණ්ඩාගාර බැඳුම්කර කල්පිරීම් සහ මහ බැංකුව සතු භාණ්ඩාගාර බැඳුම්කර සඳහා කූපන් ගෙවීම්වල ඒකාබද්ධ බලපෑම, දේශීය මුදල් වෙළඳපොළ රුපියල් ද්‍රවශීලතාවය අඩුවීම සඳහා හේතුවිය. මෑතකාලීනව, එනම් 2025 වසරේ ජූලි මාසයේ දී සාමාන්‍ය එක්දින රුපියල් ද්‍රවශීලතාවය, රුපියල් බිලියන 100ට වඩා අඩු වූ අතර, ව්‍යවහාර මුදල් සංසරණය ඉහළ යෑම, මහ බැංකුව වෙත වූ කූපන් ගෙවීම් සහ රජය විදේශ ණය සේවාකරණ ගෙවීම් සඳහා මහ බැංකුවෙන් විදේශ විනිමය මිලදී ගැනීම ඒ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය.

වෙළඳපොළ සහභාගීවන්නන් අතර පැවති අතිරික්ත ද්‍රවශීලතා තත්ත්වයන් මධ්‍යයේ, 2025 වසරේ මේ දක්වා කාලය තුළ මුදල් වෙළඳපොළ වැඩිදියුණු වූ ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කළේය. බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය, බොහෝ දුරට එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය සමඟ අනුකූලව පැවති අතර, 2025 වසරේ ජූලි අග භාගයේ දී සුළු ඉහළ යෑමක් පෙන්නුම් කළද, සාමාන්‍ය බරිත ප්‍රතිමිලදී ගැනුම් අනුපාතිකය (AWRR) ද ඒක්ෂණ මුදල් අනුපාතිකයෙහි වෙනස්වීම් සමඟ පුළුල් ලෙස සමගාමීව පැවතුණි.

17 රූප සටහන: එක්දින මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාවය සහ බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකයෙහි හැසිරීම



සටහන: ඒක්ෂණ මුදල් වෙළඳපොළෙහි ගනුදෙනු නොමැති වීම හේතුවෙන් සමහර දිනයන්හි බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය වාර්තා නොවේ

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

දේශීය ණය තත්ත්ව සහ මුදල් සැපයුම

පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණයෙහි සැලකිය යුතු ලෙස වැඩිවීම සහ බැංකු පද්ධතියේ ශුද්ධ විදේශීය වත්කම් ඉහළ යෑම, 2025 වසර තුළ දී පුළුල් මුදල් සැපයුමෙහි (M_{2b}) අඛණ්ඩ ප්‍රසාරණය සඳහා දායක විය.

2025 වසරේ මේ දක්වා කාලය තුළ බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය අඛණ්ඩව ප්‍රසාරණය වී ඇති අතර, එම ණය ප්‍රසාරණය පුළුල් පදනමකින් යුක්තව ආර්ථිකයේ සියලුම ප්‍රධාන අංශ වෙත ව්‍යාප්ත වී ඇත. මේ අතර, බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය 2025 වසරේ මැයි අවසානය වන විට 16.1% ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තා කරමින්, 2025 වසරේ ජනවාරි-මැයි දක්වා කාලය තුළ රුපියල් බිලියන 479ක පමණ සැලකිය යුතු ප්‍රසාරණයක් වාර්තා කළේය. අවධමනකාරී

තත්ත්වය මධ්‍යයේ පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය ප්‍රමාණයේ මූර්ත වාර්ෂික ලක්ෂ්‍යමය ප්‍රසාරණය[14] අඛණ්ඩව ඉහළ මට්ටමක පැවතුණි. තවද ,මෙම කාල සීමාව තුළ මුදල් සමාගම් විසින් ලබා දුන් ණය රුපියල් බිලියන 228කින් වර්ධනය වූ අතර, බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින් ලබා දුන් ණය සුළු සංකෝචනයක් වාර්තා කළේය.

18 රූප සටහන: බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට ලබා දුන් ණයෙහි මාසික වෙනස්වීම



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

මහ බැංකුව සහ බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් රජය වෙත ලබා දුන් ණය ප්‍රමාණය ඉහළ යෑම හේතුවෙන් 2025 වසරේ ජනවාරි-මැයි දක්වා කාලය තුළ බැංකු පද්ධතිය මගින් රජයට ලබා දුන් ශුද්ධ ණය ප්‍රමාණය ඉහළ ගියේය. බලපත්‍රලාභී වාණිජ බැංකු සතුව විශාල වශයෙන් රජයේ තැන්පතු තිබියදීත්, රජයේ සුරැකුම්පත් මත සිදු කරන ලද ආයෝජන ඉහළ යෑම හේතුවෙන්, මෙම කාලය තුළ බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් රජය වෙත ලබා දුන් ශුද්ධ ණය ප්‍රමාණයෙහි ඉහළ යෑමක් සිදු විය. මේ අතර, මුහුණත වටිනාකමේ සුළු අඩු වීමක් වාර්තා වුවද, තක්සේරු වටිනාකමෙහි සිදු වූ වෙනස්වීම හේතුවෙන් මහ බැංකුව විසින් රජය වෙත ලබා දුන් ශුද්ධ ණය ප්‍රමාණයෙහි ඉහළ යෑමක් වාර්තා විය.

ලංකා පොහොර සංස්ථාව, මාර්ග සංවර්ධන අධිකාරිය සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සිදු කරන ලද ශුද්ධ ණය ආපසු ගෙවීම්, 2025 වසරේ ජනවාරි-මැයි දක්වා කාලය තුළ බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් රජය සතු ප්‍රධාන වාණිජ ව්‍යාපාර වෙත ලබා දුන් ණය ප්‍රමාණය සංකෝචනය වීමට ප්‍රධාන වශයෙන් හේතු විය.

විදේශීය අංශයේ දක්නට ලැබුණු කාර්යසාධනයේ වැඩි දියුණු වීම පිළිබිඹු කරමින්, 2025 වසරේ මේ දක්වා කාලය තුළ බැංකු පද්ධතියේ ශුද්ධ විදේශීය වත්කම් අඛණ්ඩව වැඩිදියුණු විය. සමස්ත ප්‍රසාරණයට දායක වෙමින්, මහ බැංකුව සතු ශුද්ධ විදේශීය වත්කම් සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, මේ සඳහා නිල සංචිත ශක්තිමත් කිරීම

[14] කොළඹ පාරිභෝගික මිල දර්ශකය (CCPI, 2021=100) මත පදනම්ව පෙර කාලච්ඡේද සඳහා ඇස්තමේන්තු කළ උද්ධමන දර්ශකයක් (backcast inflation index) සඳහා පෞද්ගලික අංශය වෙත ලබා දුන් නාමික ණය ගැළපීම මගින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් මූර්ත ණය ගණනය කර ඇත.

සඳහා මහ බැංකුව විසින් සිදු කරන ලද විදේශ විනිමය මිලදී ගැනීම් බොහෝ දුරට සහාය විය. විදේශ මුදල්වලින් නාමනය කරන ලද වත්කම්වල දේශීය වශයෙන් ආයෝජනය කිරීමේ අවස්ථාවන් නොමැති තත්ත්වයක දී, අනේවාසිකයින් වෙත ලබා දුන් ණය සහ විදේශීය බැංකු වෙතැති ශේෂයන් ඉහළ යෑම, බලපත්‍රලාභී වාණිජ බැංකු සතු ශුද්ධ විදේශීය වත්කම් අඛණ්ඩව ඉහළ යෑමට ප්‍රධාන වශයෙන් හේතු විය.

මෙම ප්‍රවණතාවන්ට අනුකූලව, පුළුල් මුදල් සැපයුමෙහි (M_{2b}) වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය, 2024 වසර අවසානයේ වාර්තා වූ 8.6% සිට 2025 මැයි මාසයේ දී 9.9% දක්වා ඉහළ ගියේය.

19 රූප සටහන: පුළුල් මුදල් සැපයුමේ (M_{2b}) වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය සඳහා දායකත්වය



සටහන: 2025 ජනවාරි-මැයි දක්වා කාලය තුළ ප්‍රධාන වශයෙන් රඳවාගත් ලාභ සහ සංචිත ඉහළ යාම හේතුවෙන් මහ බැංකුවේ සහ බලපත්‍රලාභී වාණිජ බැංකුවල අනෙකුත් අයිතම (ශුද්ධ) අගය පහළ ගොස් ඇත.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

3.4. විදේශීය අංශය

වසරේ මේ දක්වා කාලය තුළ විදේශීය අංශය ඔරොත්තු දීමේ හැකියාවෙන් යුක්ත වූ අතර, මූල්‍ය ගිණුමේ මන්දගාමී ක්‍රියාකාරිත්වය මධ්‍යයේ වුවද, 2025 වසරේ පළමු භාගය තුළ දී ජංගම ගිණුමේ අතිරික්තයක් වාර්තා විය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (ජා.මූ. අරමුදලේ) විස්තීර්ණ ණය පහසුකමේ පස්වන වාරිකය ලැබීමත් සමඟ සංචිත තත්ත්වය ශක්තිමත් වූ අතර, විනිමය අනුපාතිකය බොහෝ දුරට ස්ථාවරව පවතී.

ගෙවුම් තුලනය

2025 වසරේ පළමු භාගය තුළ දී ජංගම ගිණුම එ.ජ. ඩොලර් බිලියන 1.5ක අතිරික්තයක් වාර්තා කළේය. මෙයට ප්‍රධාන වශයෙන් සේවා සහ ද්විතීයික ආදායම් ගිණුම්වල ශක්තිමත් ක්‍රියාකාරිත්වය සහ ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය සැලකිය යුතු ලෙස අඩුවීම හේතු විය. 2025 වසරේ පළමු භාගය තුළ දී වෙළඳ භාණ්ඩ ගිණුමේ හිඟය එ.ජ. ඩොලර් බිලියන 3.3ක් දක්වා පුළුල් විය. වෙළඳ භාණ්ඩ අපනයන සහ ආනයන යන දෙකම වැඩි වූ අතර, රෙදිපිළි, ඇඟලුම් සහ ආහාර, පාන වර්ග හා දුම්කොළවල ඉහළ ඉපැයීම් අපනයන වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වූ

අතර ආනයන වැඩිවීමට ප්‍රධාන වශයෙන් ඉහළ ගිය වාහන ආනයන හේතු විය. මීට අමතරව, සංචාරක ඉපැයීම් ජංගම ගිණුමට සැලකිය යුතු ලෙස දායක වූ අතර, එය 10%කින් වැඩිවීමට මිලියන 1.2ක් පමණ වූ සංචාරක පැමිණීම් දායක විය. විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ද ශක්තිමත් වර්ධනයක් පෙන්නුම් කළ අතර, එය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 19%කින් පමණ, එ.ජ. ඩොලර් බිලියන 3.7ක් දක්වා ඉහළ ගියේය. සමස්තයක් ලෙස, වෙළඳ භාණ්ඩ නොවන අනෙකුත් ලැබීම් ඉහළ යෑම සහ විවිධ ආදායම් සංරචක වැඩිදියුණු වීම ජංගම ගිණුම ශක්තිමත් වීමට සැලකිය යුතු ලෙස දායක විය.

එනමුත්, මෙම වසර තුළ මේ දක්වා මූල්‍ය ගිණුමේ කාර්ය සාධනය මන්දගාමීව පැවතුණි. 2025 වසරේ පළමු කාර්තුවේ දී සෘජු ආයෝජන ව්‍යවසාය වෙත ලැබුණු විදේශීය ණය ඇතුළු විදේශීය සෘජු ආයෝජන ලැබීම්, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව වැඩිදියුණුවක් පෙන්නුම් කළ නමුත් සමස්තයක් ලෙස මෙම ලැබීම් අඩු මට්ටමක පැවතුණි. මේ අතර, 2025 වසරේ පළමු භාගය තුළ දී රජයේ සුරැකුම්පත් වෙළඳපොළෙහි විදේශීය ආයෝජන අඩු මට්ටමක ශුද්ධ ලැබීමක් වාර්තා කළ අතර, ප්‍රාථමික සහ ද්විතීයික වෙළඳපොළ ගනුදෙනු ඇතුළුව කොළඹ කොටස් වෙළඳපොළෙහි විදේශීය ආයෝජන 2025 වසරේ ජනවාරි සිට ජූනි දක්වා කාලය තුළ දී සුළු ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය.

20 රූප සටහන: වෙළඳ ගිණුම



මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා රේගුව

21 රූප සටහන: සංචාරක කර්මාන්තය සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ



මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
බලපත්‍රලාභී බැංකු

22 රූප සටහන: ජංගම ගිණුම



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

23 රූප සටහන: මූල්‍ය ගිණුම



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

2025 වසරේ ජනවාරි මාසයේ දී වාහන ආනයන මත පනවා තිබූ සීමාවන් ලිහිල් කිරීමත් සමඟ, 2025 වසර මුල් භාගයේ දී වාහන ආනයනය කිරීමේ කැපී පෙනෙන වැඩිවීමක් දක්නට ලැබුණි. ඒ අනුව, පුද්ගලික රථවාහන සහ වාණිජ කටයුතු සඳහා යොදා ගන්නා වාහන ඇතුළුව මුළු වාහන ආනයන වියදම 2025 වසරේ පළමු භාගය තුළ දී එ.ජ. ඩොලර් මිලියන 475ක් විය. දැනට වාහන සඳහා පවතින ඉල්ලුම ඉහළ යාමේ ප්‍රවණතාවයක් පැවතිය ද, දිගු කලක් වාහන ආනයන සීමා කිරීමෙන් අනතුරුව එම සීමා ඉවත් කිරීම නිසා වර්ධනය වී ඇති අධික ඉල්ලුම ක්‍රමයෙන් අඩු වීමත් සමඟ තත්ත්වය ස්ථාවර වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

24 රූප සටහන: පෞද්ගලික රථවාහන සහ වාණිජ කටයුතු සඳහා යොදා ගන්නා වාහන ආනයන සංයුතිය



මූලය: ශ්‍රී ලංකා රේගුව

විනිමය අනුපාතිකය

වාහන ආනයන සීමාවන් ලිහිල් කිරීම සහ ආනයන ඉහළ යෑම මධ්‍යයේ, 2025 වසරේ ජූලි මස 22 වන දින දක්වා කාලය තුළ ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයට සාපේක්ෂව 3.1%ක සුළු අවප්‍රමාණය වීමක් වාර්තා කළේය. එයට අමතරව, එ.ජ. ඩොලරයට සාපේක්ෂව අනෙකුත් ප්‍රධාන විදේශ ව්‍යවහාර මුදල් ඒකක කිහිපයක් පොදුවේ ශක්තිමත් වීම පිළිබිඹු කරමින්, එම මුදල් ඒකකවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය විය. 2025 වසරේ ජූලි මස 22 වන දින දක්වා කාලය තුළ දී නාමික සඵල විනිමය අනුපාතිකය (නා.ස.වි.අ.) සහ මූර්ත සඵල විනිමය අනුපාතිකය (මූ.ස.වි.අ.) යන දෙකම පහළ යමින් අවප්‍රමාණය වීමක් පිළිබිඹු කළේය. ඒ අනුව, මුදල් වර්ග 5කින් සැදුම්ලත් පැස මත පදනම් වූ නා.ස.වි.අ. දර්ශකය 7.6%කින් සහ මුදල් වර්ග 5කින් සැදුම්ලත් පැස මත පදනම් වූ මූ.ස.වි.අ. දර්ශකය 7.4%කින් පහළ ගියේය.

25 රූප සටහන: විනිමය අනුපාතිකයේ හැසිරීම



සටහන: රූප සටහන් 2025 වසරේ ජූලි මස 22දින දක්වා යාවත්කාලීන කර ඇත.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

සංචිත වත්කම්

මහ බැංකුව විසින් දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ වෙතින් අඛණ්ඩව විදේශ විනිමය මිල දී ගැනීම් සිදු කළ ද, 2025 වසරේ මාර්තු මාසයේ දී එ.ජ. ඩොලර් බිලියන 6.5ක් පමණ දක්වා ඉහළ ගිය දළ නිල සංචිත[15] මූලිකවම රජයේ ණය සේවාකරණ ගෙවීම් හේතුවෙන් 2025 ජූනි මාසය අවසන් වන විට එ.ජ. ඩොලර් බිලියන 6.1ක් පමණ දක්වා අඩු විය. 2025 වසරේ ජූලි මස 22 දක්වා කාලය තුළ දී මහ බැංකුව විසින් දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ වෙතින් ශුද්ධ පදනම මත එ.ජ. ඩොලර් බිලියන 1.1ක් පමණ මිල දී ගන්නා ලදී. ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකමෙහි පස් වන වාරිකය ලෙස එ.ජ. ඩොලර් මිලියන 350ක් පමණ ලැබීම ද දළ නිල සංචිත ඉහළ නැංවීම සඳහා උපකාරී විය.

26 රූප සටහන: මාසික දළ නිල සංචිත, සංචිත ප්‍රමාණාත්මකභාවය සහ ශුද්ධ මිලදී ගැනීම්



සටහන: චීන මහජන බැංකුවෙන් ලද විදේශ විනිමය හුවමාරු පහසුකම මාසික දළ නිල සංචිතවලට ඇතුළත් වන අතර, එය භාවිතා කිරීම යම් කොන්දේසිවලට යටත් වේ.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

3.5. රාජ්‍ය මූල්‍ය අංශය

ආදායම් මත පදනම් වූ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාමාර්ග සඳහා වූ රජයේ දැඩි කැපවීම පිළිබිඹු කරමින් 2025 sවසරේ ජනවාරි සිට මැයි[16] දක්වා වූ කාලපරිච්ඡේදය තුළ දී රාජ්‍ය මූල්‍ය අංශයේ කාර්යසාධනය අඛණ්ඩ වර්ධනයක් පෙන්නුම් කළේය. එම ක්‍රියාමාර්ග, මෙම කාලපරිච්ඡේදය තුළ ප්‍රාථමික ශේෂයේ සැලකිය යුතු අතිරික්තයකට සහ සමස්ත අයවැය හිඟය අඩුවීමට හේතු විය.

ශක්තිමත් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාමාර්ග අඛණ්ඩව පවත්වාගෙන යෑම හේතුවෙන් 2025 වසරේ ජනවාරි සිට මැයි දක්වා වූ කාලපරිච්ඡේදය තුළ දී සමස්ත අයවැය ශේෂය, වර්තන ගිණුමේ ශේෂය සහ ප්‍රාථමික ශේෂය යන

[15] චීන මහජන බැංකුවෙන් ලද විදේශ විනිමය හුවමාරු පහසුකමෙහි ලැබීම් අන්තර්ගත වන අතර, එය භාවිතා කිරීමේ කොන්දේසිවලට යටත් වේ.

[16] මුදල් අමාත්‍යාංශයෙන් ලැබුණු නවතම තාවකාලික දත්තවලට අනුව, 2025 වසරේ පළමු භාගයේ දී, මුළු ආදායම සහ ප්‍රදාන 2024 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ රුපියල් බිලියන 1,865ට සාපේක්ෂව රුපියල් බිලියන 2,325ක් දක්වා 24.7%කින් වර්ධනය වී ඇත. එමෙන්ම, 2024 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2025 වසරේ පළමු භාගයේ දී සමස්ත වියදම රුපියල් බිලියන 2,731ක් දක්වා 10.9%කින් වර්ධනය වී ඇත. ප්‍රාථමික ශේෂයේ අතිරික්තය රුපියල් බිලියන 859ක් දක්වා සැලකිය යුතු වර්ධනයක් වාර්තා කර ඇති අතර, 2025 පළමු භාගයේ දී සමස්ත අයවැය හිඟය රුපියල් බිලියන 406ක් දක්වා අඩු වී ඇත.

ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ශේෂයන්වල, නාමික වශයෙන් සහ පුරෝකථනය කළ ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස, වැඩි දියුණුවක් ඇති විය. ඒ අනුව, සලකා බලන ලද කාල සීමාව තුළ දී ප්‍රාථමික ශේෂය රුපියල් බිලියන 742.9ක සැලකිය යුතු අතිරික්තයක් වාර්තා කළ අතර, සමස්ත අයවැය හිඟය රුපියල් බිලියන 236.6ක් දක්වා අඩු විය.

2024 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2025 වසරේ ජනවාරි සිට මැයි දක්වා කාල සීමාව තුළ දී රජයේ මුළු ආදායම සහ ප්‍රදාන සැලකිය යුතු වැඩිවීමක් වාර්තා කළේය. බදු ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණවල බලපෑම සහ ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත්වීම පිළිබිඹු කරමින්, එකතු කළ අගය මත බද්ද, ආදායම් බදු සහ නිෂ්පාදන/සුරා බදුවලින් එකතු වූ ඉහළ බදු ආදායම්, රජයේ ආදායම වර්ධනයට මූලික වශයෙන් දායක විය. 2025 වසරේ අපේක්ෂිත ඉහළ ආදායමෙන් සැලකිය යුතු ප්‍රමාණයක් මෝටර් රථ ආනයනයට අදාළ බදු එකතු කිරීම්වලින් ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. මීට අමතරව, බදු පරිපාලනය ශක්තිමත් කිරීමේ ක්‍රියාමාර්ග සහ ආදායම් එකතු කිරීමේ ආයතනවල ආයතනික ප්‍රතිසංස්කරණ කාලෝචිත ලෙස ක්‍රියාත්මක කිරීම සමස්ත බදු ආදායමෙහි වර්ධනයට තවදුරටත් සහාය වනු ඇති අතර, එම ක්‍රියාමාර්ග මැදි කාලීනව මෙම ආදායම් වර්ධන ප්‍රවණතාව පවත්වා ගැනීම සඳහා අත්‍යවශ්‍ය වේ. මෙම කාලපරිච්ඡේදය තුළ දී පොලී, දඩ මුදල්, ගාස්තු සහ අය කිරීම් මගින් ලද ආදායම් ඉහළ යෑම හේතුවෙන් බදු නොවන ආදායම ද වර්ධනය විය. මේ අතර, 2025 වසරේ ජනවාරි සිට මැයි දක්වා කාලය තුළ දී සමස්ත වියදම් සහ ශුද්ධ ණය දීම් වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 9.7%ක වර්ධනයක් වාර්තා කළේය. මෙම වැඩිවීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ, සහනාධාර සහ සංක්‍රාම ගෙවීම්, වැටුප් සහ වේතන ගෙවීම් සහ ප්‍රතිව්‍යුහගත කරන ලද ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සඳහා ගෙවන ලද පොලිය ද ඇතුළුව පොලී ගෙවීම් සඳහා වන වියදම් ඉහළ යෑමයි. කෙසේ වෙතත්, සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී, 2024 වසරේ එම කාලපරිච්ඡේදයට සාපේක්ෂව ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය දීම් සුළු වශයෙන් පහළ යෑමක් වාර්තා කළේය.

විදේශීය ප්‍රාග්ධන වෙළඳපොළ වෙත ප්‍රවේශ වීම මෙම අවස්ථාවේ දී සිදු නොවන බැවින්, 2025 වසරේ ජනවාරි සිට මැයි දක්වා වූ කාලපරිච්ඡේදය තුළ දී අයවැය හිඟය මූල්‍යනය කිරීම සඳහා රජය මූලිකවම දේශීය මූලාශ්‍ර මත තවදුරටත් රඳා පැවතුණි.

27 රූප සටහන: ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ශේෂයන්



මූලය: මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

3.6. මූල්‍ය අංශය

ණය වර්ධනය සඳහා සහාය වන හිතකර දේශීය සාර්ව ආර්ථික තත්ත්වයන් සහ මූල්‍ය තත්ත්වය ලිහිල් වීම හේතුකොට ගෙන මූල්‍ය අංශයේ කාර්යසාධනය අඛණ්ඩව වර්ධනය විය.

ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස පෞද්ගලික අංශයේ ණය අනුපාත පරතරය (ණය පරතරය) මගින් පිළිබිඹු කෙරෙන ණය චක්‍රය, ප්‍රසාරණ අවධිය තුළ ගමන් කළේය. රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාමාර්ග මධ්‍යයේ පෞද්ගලික අංශය වෙත ලබා දෙන ණය ප්‍රසාරණය වීම මගින්, මූල්‍ය ආයතන, රජය හා රජය සතු ව්‍යවසාය වෙත නිරාවරණය වීමේ නැඹුරුව අඛණ්ඩව අඩුවීමක් දක්නට ලැබුණි.

28 රූප සටහන: ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස ණය පරතර



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

29 රූප සටහන: මූල්‍ය අංශය රජය සහ පෞද්ගලික අංශය වෙත නිරාවරණය වීම



සටහන: බැංකු අංශයේ සහ මුදල් සමාගම්වල රජය සහ පෞද්ගලික අංශ වෙත නිරාවරණය වීම මෙමගින් පෙන්නුම් කෙරේ.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

සාර්ව ආර්ථික තත්ත්වයන්ගේ වර්ධනය වීම මධ්‍යයේ මූල්‍ය අංශයේ ඔරොත්තු දීමේ හැකියාව 2025 වසරේ පළමු භාගයේ දී ක්‍රමයෙන් වැඩි දියුණු විය. ප්‍රධාන වශයෙන් ආයෝජන මෙන්ම ණය හා ලැබිය යුතු දෑ ඉහළ යෑම හේතුවෙන්, සමාලෝචනය කෙරෙන කාලය තුළ දී බැංකු අංශයේ මුළු වත්කම් වර්ධනය විය. ඒ අනුව, 2025 වසරේ ජූනි මස අවසානයේ දී බැංකු අංශයේ සමස්ත වත්කම් 14.9%ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තා කළ අතර, එහි වටිනාකම රුපියල් ට්‍රිලියන 23.8ක් විය. තවද, මුදල් ප්‍රතිපත්තියේ ලිහිල් වීම මධ්‍යයේ, දළ ණය සහ ලැබිය යුතු දෑ 2025 වසරේ ජූනි මස අවසානය වනවිට වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 11.4%ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය.

අදියර 3 ණය අනුපාතය තුළින් පිළිබිඹු වන බැංකු අංශයේ අක්‍රීය ණය, 2024 වසරේ ජූනි මාසය අවසානයේ වාර්තා වූ 12.9%ක අගයට සාපේක්ෂව 2025 වසරේ ජූනි මස අවසානයේ දී 12.0%ක් දක්වා අඩු වූ නමුත් එය තවදුරටත් ඉහළ මට්ටමක පැවතුණි. 2025 වසරේ පළමු භාගය තුළ දී බැංකු අංශයේ බදු පසු ලාභය 2024 වසරේ අනුරූප කාලයට සාපේක්ෂව සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. ඒ අනුව, බැංකු 2024 වසරේ පළමු භාගයේ දී වාර්තා කළ රුපියල් බිලියන 112.3ට සාපේක්ෂව 2025 වසරේ පළමු භාගයේ දී රුපියල් බිලියන 187.5ක බදු පසු ලාභයක් වාර්තා කළේය. බැංකු අංශයේ ලාභදායීත්ව දර්ශක පිළිබඳ ව සලකා බැලූ විට 2025 වසරේ පළමු භාගයේ දී හිමිකම් මත ප්‍රතිලාභ වර්ධනය වූ අතර, වත්කම් මත ප්‍රතිලාභ නොවෙනස්ව පැවතුණි.

ද්‍රවශීලතා ආවරණ අනුපාතය මගින් මනිනු ලබන බැංකු අංශයේ ද්‍රවශීලතාව, පෙර වසරේ අනුරූප කාලයට සාපේක්ෂව 2025 වසරේ ජූනි මාසයේ දී යම් ප්‍රමාණයකින් පහළ ගියේය. ඒ අනුව, රුපියල් ද්‍රවශීලතා ආවරණ අනුපාතය 2024 වසරේ ජූනි මාසයේ වාර්තා වූ 339.7%ට සාපේක්ෂව 2025 වසරේ ජූනි මාසයේ දී 328.6%ක් දක්වා පහළ ගිය අතර, සියලු මුදල් ද්‍රවශීලතා ආවරණ අනුපාතය 2024 වසරේ ජූනි මාසයේ දී වාර්තා වූ 293.4%ට සාපේක්ෂව 2025 වසරේ ජූනි මාසයේ දී 283.1%ක් දක්වා පහළ ගියේය. කෙසේ වුවද, බැංකු අංශයේ ද්‍රවශීලතා ආවරණ අනුපාතය අවම අවශ්‍යතා මට්ටමට වඩා සැලකිය යුතු ඉහළ අගයක පැවතුණි. මේ අතර, බැංකු අංශයේ සමස්ත ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය අවසානයේ වාර්තා වූ 17.7%ට සාපේක්ෂව 2025 වසරේ මාර්තු මස අවසානය වන විට 19.3%ක් දක්වා වර්ධනය වූ අතර, අවදානම් බරිත වත්කම් වර්ධනයට සාපේක්ෂව සමස්ත නියාමන ප්‍රාග්ධන වර්ධනය ඉහළ මට්ටමක පැවතීම එයට හේතු විය. ඒ අනුව, 2025 වසරේ මාර්තු මස අවසානයේ දී බැංකු අංශයේ නියාමන ප්‍රාග්ධනය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 19.0%ක කැපී පෙනෙන වර්ධනයක් වාර්තා කළේය. ප්‍රකාශයට පත් කළ රඳවා ගත් ඉපැයුම්, සුදුසුකම් ලබන ස්ථර-2 ප්‍රාග්ධන උපකරණ සහ සාමාන්‍ය සංචිතවල ඉහළ යෑම මෙන්ම ශුද්ධ විලම්බිත බදු වත්කම් පහළ යෑම එයට හේතු වූ අතර, බැංකු අංශයේ ප්‍රාග්ධන ස්වාරක්ෂකවල වර්ධනය එමගින් පිළිබිඹු කෙරේ.

ප්‍රධාන වශයෙන් ණය සහ අත්තිකාරම්වල ඉහළ යෑම හේතුවෙන් 2025 වසරේ ජූනි මස අවසානයේ දී මුදල් සමාගම් අංශයේ වත්කම් ද 25.8%ක වාර්ෂික ලක්ෂ්‍යමය ප්‍රසාරණයක් වාර්තා කළේය. ඒ අනුව, මූලිකව වාහන ණය, මූල්‍ය කල්බදු, සහ රන් ණය ඉහළ යෑම හේතුවෙන් 2025 වසරේ ජූනි මස අවසානයේ දී මෙම අංශයේ ණය සහ අත්තිකාරම් කළඹ 35.1%ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය. මෙම අංශයේ දළ අක්‍රීය ණය අනුපාතිකය, 2024 වසරේ ජූනි අග වන විට වාර්තා වූ 13.6%ට සාපේක්ෂව, 2025 වසරේ ජූනි මස අවසානය වන විට 8.3%ක් දක්වා අඩු වී ඇති අතර, එමගින් ණය කළඹේ ගුණාත්මකභාවයේ දියුණුවක් පෙන්නුම් කෙරේ. කෙසේ වෙතත්, මුදල් සමාගම් අංශයේ ණය කළඹ වාහන සහ රන් මත ලබා දුන් ණය කෙරෙහි විශාල ලෙස සංකේන්ද්‍රණය වී පැවතුණි. රුපියල් බිලියන 114.6ක ද්‍රවශීලතා අතිරික්තයක් සමඟ 2025 වසරේ ජූනි මස අග

වන විට මෙම අංශයේ ද්‍රවශීලතා තත්ත්වය නියාමන අවශ්‍යතා අභිභවා පැවතුණි. තවද, 2025/26 මුදල් වර්ෂයේ පළමු කාර්තුව නියෝජනය කරමින්, 2025 වසරේ අප්‍රේල් සිට ජූනි දක්වා කාලය තුළ මෙම අංශයේ බදු පසු ලාභය රුපියල් බිලියන 18.0ක් විය. ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාව සම්බන්ධයෙන් ගත් කළ, 2025 වසරේ ජූනි මස අවසානයේ දී මුදල් සමාගම් අංශය 22.0%ක ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතයක් වාර්තා කළේය.

කොටස් වෙළඳපොළ සලකා බැලීමේ දී, 2025 වසර ආරම්භයේ සිට ජූනි මස අග වන විට සියලු කොටස් මිල දර්ශකය (ASPI) සහ ස්ටැන්ඩර්ඩ් ඇන්ඩ් පුවර්ස් ශ්‍රී ලංකා 20 (S&P SL20) දර්ශකය, පිළිවෙළින්, 13.1%ක හා 10.1%ක වර්ධනයක් වාර්තා කරමින් කැපී පෙනෙන ප්‍රගතියක් පෙන්නුම් කළේය. ලිහිල් මුදල් තත්ත්ව මධ්‍යයේ වැඩි දියුණු වූ ආයතනික හා ආර්ථික ක්‍රියාකාරිත්වය සහ ඉදිරි දැක්ම හේතුවෙන් දේශීය ආයෝජකයන්ගේ සහභාගීත්වය ඉහළ යෑම මෙම වර්ධන ප්‍රවණතාවට මූලිකවම බලපෑවේය.

3.7. ගෝලීය ප්‍රවණතා

මෑත කාලීන එක්සත් ජනපද තීරුබදු නිවේදන සහ අන්තර්ජාතික වෙළඳාම කෙරෙහි ඒවායේ බලපෑම මධ්‍යයේ ගෝලීය ප්‍රතිපත්ති පිළිබඳ අවිනිශ්චිතතා ඉහළ යෑම ගෝලීය ආර්ථික අපේක්ෂා සහ වෙළඳපොළ අපේක්ෂා කෙරෙහි සැලකිය යුතු ලෙස බලපෑම් ඇති කළේය. භූ දේශපාලනික අර්බුදකාරී තත්ත්ව නැවත මතුවීම හේතුවෙන් ගෝලීය භාණ්ඩ මිල ගණන් පිළිබඳ දැක්ම අස්ථාවරව සහ අවිනිශ්චිතව පවතී. මීට ප්‍රතිචාර වශයෙන් ලොව ප්‍රධාන මහ බැංකු සිය මුදල් ප්‍රතිපත්තිය වඩාත් සුපරීක්ෂාකාරීව ලිහිල් කිරීමට යොමුවී ඇති අතර, නැවත මතු වූ වෙළඳ අර්බුද බොහෝ රටවල ප්‍රතිපත්ති සම්පාදනයේ දී ප්‍රධාන සාධකයක් ලෙස සලකයි.

එක්සත් ජනපද තීරුබදු නිවේදන මධ්‍යයේ ආර්ථික හා වෙළඳ ප්‍රතිපත්ති අවිනිශ්චිතතා ඉහළ යෑම ගෝලීය වර්ධනයට බොහෝ දුරට බලපානු ඇත. මීට අමතරව, නැවත නැවත මතුවන භූ දේශපාලනික අර්බුද ඉදිරි කාලපරිච්ඡේදය තුළ දී ගෝලීය වර්ධනය අඩු වීමට සැලකිය යුතු අවදානමක් ඇති කරයි.[17] එක්සත් ජනපදයේ සඵලදායී තීරුබදු ඉහළ යෑම හේතුවෙන් ගෝලීය වෙළඳපොළ වර්ධනයට බලපෑ හැකි අතර, එමගින් දියුණු සහ නැගී එන වෙළඳපොළ ආර්ථිකයන් කෙරෙහි සමානුපාතික නොවන බලපෑමක් ඇති කළ හැකිය. ගෝලීය උද්ධමනය සම්බන්ධයෙන් මිශ්‍ර සංඥා පවතින අතර, යුරෝපා කලාපය ඇතුළු ආර්ථිකයන් කිහිපයක උද්ධමනය අඩු වීමක් ද ඇමරිකා එක්සත් ජනපදයේ උද්ධමනය තරමක් ඉහළ යෑමක් ද දක්නට ලැබේ. කෙසේ වෙතත්, අඩු ඉල්ලුම් තත්ත්ව සහ පහළ වැටෙමින් පවතින බලශක්ති මිල ගණන් හේතුවෙන් 2025 වසරේ දී සමස්ත ගෝලීය උද්ධමනය අඩු මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.[18]

එක්සත් ජනපදය විසින් සිය වෙළඳ හවුල්කරුවන්ගෙන් සිදුකරන ආනයන සඳහා තීරුබදු ඉහළ නැංවීම හේතුවෙන් ප්‍රතිවාදී වෙළඳ ක්‍රියාමාර්ග, සැපයුම් දාම බාධා, සහ ගෝලීය නිෂ්පාදන පිරිවැය ඉහළ යෑම පිළිබඳ බියක් නිර්මාණය වීම නිසා ගෝලීය ප්‍රතිපත්ති අවිනිශ්චිතතා දර්ශකය 2025 වසරේ අප්‍රේල් මාසයේ දී ඉතිහාසයේ

---

[17] 2025 වසරේ ජූලි 29 වන දින නිකුත් කරන ලද ජා.මු. අරමුදලෙහි ලෝක ආර්ථික දැක්මෙහි (World Economic Outlook-WEO) යාවත්කාලීන වාර්තාවට අනුව, 2024 වසරේ දී 3.3%ක් වූ ගෝලීය වර්ධනය 2025 වසරේ දී 3.0%ක් දක්වා මන්දගාමී වනු ඇතැයි ද 2026 වසරේ දී 3.1%ක් දක්වා සුළු වශයෙන් ඉහළ යනු ඇතැයි ද පුරෝකථනය කර ඇත. නව පුරෝකථන, 2025 වසරේ අප්‍රේල් මස දී සිදුකළ පුරෝකථනයන්ට වඩා ඉහළ මට්ටමක පැවතුණ ද, එය පූර්ව කොවිඩ් වසංගත සමයේ පැවති සාමාන්‍යයට වඩා අඩු මට්ටමක පවතී.

[18] 2024 වසරේ දී 5.6%ක් වූ ගෝලීය උද්ධමනය, 2025 වසරේ දී 4.2%ක් සහ 2026 වසරේ දී 3.6%ක් ලෙස පුරෝකථනය කර ඇති අතර, විවිධ රටවල් සඳහා උද්ධමනය පුරෝකථනයන් වෙනස් වේ (ලෝක ආර්ථික දැක්ම, ජූලි 2025).

මෙතෙක් වාර්තා කළ ඉහළම අගයට ළඟා වීමට හේතු විය. මේ අතර, දියුණු රටවල ආර්ථිකයන් අඛණ්ඩව පවතින රාජ්‍ය මූල්‍ය හිඟයන් මධ්‍යයේ ණය සේවාකරණ පිරිවැය ඉහළ යෑම පිළිබඳ වැඩි වශයෙන් අවධානය යොමු කරමින් සිටියි. උත්සන්න වන භූ දේශපාලනික ආතතීන් සහ කලාපීය ගැටුම්, ගෝලීය ආර්ථික දැක්ම මත අඛණ්ඩව බලපෑම් ඇති කරන අතර, එමගින් අවිනිශ්චිතතා තවදුරටත් ඉහළ යෑමට හේතු වේ.

30 රූප සටහන: ගෝලීය ආර්ථික ප්‍රතිපත්ති අවිනිශ්චිතතා දර්ශකය (Global Economic Policy Uncertainty Index)



මූලය: fred.stlouisfed.org

2025 වසරේ දී බොහෝ රටවල් තම මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය ලිහිල් කළ ද, ගෝලීය ආර්ථික අවිනිශ්චිතතාව ඉහළ යෑම මධ්‍යයේ මහ බැංකු තවදුරටත් ලිහිල්කරණය සම්බන්ධයෙන් ප්‍රවේශම් සහගතව සිටී. උද්ධමනය ඉලක්කයට වඩා ඉහළින් පැවතීම සහ මෑත කාලීන තීරුබදු ඉහළ යෑම හා මූල්‍ය තත්ත්වයන් දැඩි වීම හේතුවෙන් ඇති වූ අවිනිශ්චිතතාව ඉහළ යෑම හේතුවෙන්, එක්සත් ජනපද ෆෙඩරල් සංචිත බැංකුව 2025 වසරේ මේ දක්වා කාලය තුළ සිය මුදල් ප්‍රතිපත්ති පොලී අනුපාතිකය නොවෙනස්ව තබා ගත්තේය. තවද, එක්සත් ජනපද ෆෙඩරල් සංචිත බැංකුව විසින් මෙහෙයවන ලද ප්‍රමාණාත්මක දැඩි කිරීමේ (Quantitative Tightening) වැඩසටහන අවසන් වීමට ආසන්න වීමත් සමඟ, එහි වේගය සැලකිය යුතු ලෙස මන්දගාමී වී ඇත. කෙසේ වෙතත්, නිලධාරීන්ගේ තිත් ප්‍රස්ථාර ප්‍රක්ෂේපණ මගින් වසරේ ඉතිරි කාලය තුළ දී පොලී අනුපාතික අඩුකිරීම් දෙකක් සිදුවිය හැකි බව පෙන්නුම් කෙරේ.[19] 2025 වසරේ මේ දක්වා යුරෝපීය මහ බැංකුව එහි ප්‍රධාන පොලී අනුපාතිකය සිව් වතාවක් අඩු කරමින් මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කිරීම අඛණ්ඩව සිදු කළේය.[20] ලිහිල් උද්ධමන තත්ත්ව සහ දේශීය ආර්ථිකයේ මන්දගාමී බව හේතු වශයෙන් දක්වමින් එංගලන්ත මහ බැංකුව 2024 වසරේ අගෝස්තු මාසයේ සිට මුදල් ප්‍රතිපත්තිය ක්‍රමයෙන් ලිහිල් කර ඇත. කෙසේ වෙතත්, ගෝලීය අවිනිශ්චිතතාව සහ උද්ධමනය ඉලක්කයට වඩා ඉහළින් පැවතීම හේතුවෙන්, එංගලන්ත මහ බැංකුව 2025 වසරේ ජූනි මාසයේ දී ප්‍රතිපත්ති පොලී අනුපාතිකය නොවෙනස්ව තබා ගත්තේය.[21] ජනවාරි මාසයේ දී පොලී අනුපාතික ඉහළ දැමීමකින් පසුව, ගෝලීය වෙළඳ අර්බුද ඉහළ යෑම සහ උද්ධමනය පිළිබඳ ප්‍රවේශම් සහගත ඉදිරි දැක්ම හේතු ලෙස පෙන්වා

[19] 2025 වසරේ ජූලි මාසයේ දී එක්සත් ජනපද ෆෙඩරල් සංචිත බැංකුව, එහි පස්වන ෆෙඩරල් විවෘත වෙළඳපොළ කමිටු රැස්වීමේ දී, ෆෙඩරල් අරමුදල් අනුපාතිකය 4.25-4.50%ක මට්ටමේ අඛණ්ඩව පවත්වා ගෙන ගියේය.

[20] 2025 වසරේ ජූලි මස 24 වන දින පැවති පාලක මණ්ඩල රැස්වීමේ දී යුරෝපීය මහ බැංකුව, එහි ප්‍රධාන පොලී අනුපාතික තුන නොවෙනස්ව තබා ගැනීමට තීරණය කළේය.

[21] එංගලන්ත මහ බැංකුව 2025 වසරේ අගෝස්තු මාසයේ දී සිය බැංකු අනුපාතිකය 4%ක් දක්වා පදනම් අංක 25කින් අඩු කළේය.

දෙමින්, 2025 වසරේ ජූනි මාසයේ දී ජපාන මහ බැංකුව එහි කෙටිකාලීන ප්‍රතිපත්ති පොලී අනුපාතිකය නොවෙනස්ව තබා ගත්තේය. ජපාන මහ බැංකුවේ මෙම තීරණය මගින් ප්‍රවේශම් සහගත ස්ථාවරයක් පිළිබිඹු කෙරෙන අතර, අවිනිශ්චිතතාව පහව ගිය පසු සහ උද්ධමන ප්‍රවණතාව එහි ඉලක්කය සමඟ වඩාත් අනුකූල වූ පසු පොලී අනුපාතික ඉහළ දැමීම නැවත ආරම්භ කිරීමේ අවස්ථාව පවත්වා ගෙන ඇත. මීට අමතරව, ජපාන මහ බැංකුව විසින් රජයේ සුරැකුම්පත් මිලදී ගැනීම සීමා කිරීම පිළිබඳ සිය සැලසුම් නිවේදනය කර ඇත. තවද, නැගී එන වෙළඳපොළ ආර්ථිකයන්හි මහ බැංකුවල මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය විවිධ වන අතර, එකිනෙකට වෙනස් දේශීය උද්ධමන ප්‍රවණතා, විනිමය අනුපාතික පීඩන සහ වෙනස් වෙමින් පවතින ගෝලීය ආර්ථික අවිනිශ්චිතතාවට දක්වන ලද විවිධකාර ප්‍රතිචාර මෙමගින් මනාව පිළිබිඹු වේ. වර්ධනය වන අවිනිශ්චිතතාව සහ වෙළඳ පිරිවැයෙහි මූලික ඉහළ යෑම හේතුවෙන් පොදුවේ මිල සහ වැටුප් පීඩන වර්ධනය වීමකට ඉඩ ප්‍රස්ථා පැවතීම මධ්‍යයේ ඉදිරි කාලයේ දී මහ බැංකු ප්‍රවේශම් සහගතව ක්‍රියා කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. අවදානම් පිළිබඳ ඉදිරි දැක්ම රටවල් අනුව වෙනස් වනු ඇත. බොහෝ රටවල ප්‍රතිපත්ති තීරණ, වර්ධනය වන අවිනිශ්චිතතාව සහ දූර්වල අපනයනවල සෘණාත්මක බලපෑම මගින් තීරණය වීමට අවකාශය ඇති අතර, ඉහළ තීරු බදු ක්‍රියාත්මක කරන රටවල ප්‍රධාන අවධානය උද්ධමන පීඩනය ඉහළ යෑම දෙසට යොමු විය හැකිය.

31 රූප සටහන: ගෝලීය ප්‍රතිපත්ති පොලී අනුපාතික වෙනස්වීම්



සටහන: 2025 වසරේ ජූලි මස 22වන දිනට පවතින දත්ත මත පදනම් වේ.

මූලය: https://www.cbrates.com

ඉල්ලුම් සහ සැපයුම් පැතිකඩ දෙකෙහිම පීඩන හේතුවෙන් ගෝලීය ආහාර ද්‍රව්‍ය මිල ගණන් මෑත කාලයේ දී අස්ථාවරව පැවතුණි. ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ ගෝලීය ආහාර මිල දර්ශකය 2024 වසර අවසානයේ වාර්තා වූ දර්ශක අගය වන 127.4 සිට 2025 වසරේ ජූනි මාසයේ දී දර්ශක අගය 128.0ක් දක්වා සුළු වශයෙන් වැඩි විය. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ, ඉහළ ඉල්ලුම මධ්‍යයේ ගෝලීය සැපයුම අඩු වීම හේතුවෙන් මස් සහ කිරි නිෂ්පාදනවල මිල දර්ශකවල ඉහළ යෑමයි. ධාන්‍ය වර්ග, තෙල් සහ සීනි මිල දර්ශක පහළ යෑම, අනෙකුත් උප දර්ශකවල ඉහළ යෑම තරමක් සමනය කර ඇත. මේ අතර, මැද පෙරදිග ඉහළ ගිය භූ දේශපාලනික අර්බුද මධ්‍යයේ ඇති වූ සැපයුම් අවිනිශ්චිතතාව හේතුවෙන් 2025 වසරේ පළමු භාගය අවසානයේ දී ගෝලීය බලශක්ති මිල ගණන් යම් ඉහළ යෑමේ පීඩනයකට ලක් විය. කෙසේ වෙතත්, ඊශ්‍රායලය සහ ඉරානය අතර සටන් විරාම ගිවිසුමෙන් පසු ජූනි මස අවසානය වන විට මිල ගණන් ස්ථාවර විය.

32 රූප සටහන: ගෝලීය වෙළඳ භාණ්ඩ මිල ගණන්



මූලය: ආහාර හා කෘෂිකර්ම සංවිධානය



මූලයන්: රෙෆිනිටිව් (රොයිටර්ස්), බ්ලූම්බර්ග් තොරතුරු සේවය, සෞදි ඇරම්කො

ISBN 978-624-6764-09-8